# නර්තනය

පළමු වාරය

## අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල I, II

## 6 ශ්‍රේණිය



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

නර්තනය - පළමු වාරය
අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල 1,2 (සි) - 6 ශ්‍රේණිය
நடனம் - முதலாம் தவணை
அத்தியாவசியக் கற்றல் மொடியூல்கள் 1,2 (சி) - தரம் 6
SC06EC1S -2026/321/84,800

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා


අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ-තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මගින් නැරඹිය හැකි ය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e-Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
ChannelNIE
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books


අප රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය ලබන වසරේදීත් ඔබ සහෝදර, සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න.

පාසලේ නම : ..........................................................................................................

| | මොඩියුලය ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පංති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# නර්තනය

## පළමු වාරය

### අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල - I, II

# 6 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**නර්තනය - 6 ශ්‍රේණිය**
අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල - I, II
පළමු වාරය

මොඩියුලය - I
**පරිසරය රසවිඳිමින් චලන නිර්මාණය කරමු**

මොඩියුලය - II
**සම්ප්‍රදාය ඇසුරින් නිර්මාණ කරමු**

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

**ISBN 978-624-5729-87-6**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
දෙල්ගොඩ, කඳුබොඩ, කැරගල පාර, අංක 35/3 දරන ස්ථානයෙහි පිහිටි
සැන්වින් පුද්ගලික සමාගමෙහි
මුද්‍රණය කරවන ලදි.

Published by : National Institute of Education
Printed by : Sanvin (Pvt) Ltd.
No. 35/3, Keragala Road, Kanduboda, Delgoda.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් මොඩියුල, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් මොඩියුල ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

# උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

: ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : කේ. පී. අජිත් රූපසේන, අධ්‍යක්ෂ
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණ** : රවීන්ද්‍ර තේනුවර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

මරීනා ශිරන්ති ද සොයිසා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :**

| | |
|---|---|
| මරීනා ශිරන්ති ද සොයිසා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| එස්. වර්ණසිංහ | - අධ්‍යක්ෂ (විශ්‍රාමික), ජාතික අධ්‍යාපන ආයතනය |
| යූ. කේ. මහීපාල | - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>සෞන්දර්ය ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය |
| එස්. එම්. ඩී. ජී. සේනානායක | - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| කේ. සුසන්ත ගුණවර්ධන | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය, වත්තේගම. |
| එම්. දම්මිත් ප්‍රනාන්දු | - ගුරු උපදේශක (විශ්‍රාමික), කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| එච්. එල්. සමන් කුමාර | - ශ්‍රී ලංකා ගුරු සේවය, බප/පිළි මධ්‍ය මහා විද්‍යාලය |
| පද්මිණී කුමාරි වික්‍රමසිංහ | - විදුහල්පති, බප/හෝ/ මහින්ද රාජපක්ෂ විද්‍යාලය |
| කේ. ඩී. සජිකා නිරෝෂනී | - ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/කලු/ ශ්‍රී ඥාණිස්සර මහා විද්‍යාලය |
| ඒ. ජී. ගයන්ත සංජීව | - කථිකාචාර්ය - මහවැලි අධ්‍යාපන විද්‍යාපීඨය, පොල්ගොල්ල. |
| ආර්. ඒ. මනුල රත්නායක | - කථිකාචාර්ය, වයඹ අධ්‍යාපන විද්‍යාපීඨය, බිංගිරිය. |
| ඩී. ශානිකා චතුරානි ආටිගල | - ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/හෝ/ පහත්ගම රෝමානු කතෝලික කනිෂ්ඨ විද්‍යාලය |

**භාෂා සංස්කරණය** : මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
එච්. ජී. ප්‍රියංකා, ශ්‍රී ලංකා ගුරු සේවය, මහින්ද රාජපක්ෂ විද්‍යාලය

**යතුරු ලියනය** : එන්. එම්. සරත් කුමාර, ශ්‍රී ලංකා විදුහල්පති සේවය
ගම්/ජනාධිපති විද්‍යාලය, මහර, කඩවත.

**පිටු සැකසීම** : එච්. ටී. තරංග දිල්ෂාන්
ඩබ්. එම්. ධම්මිකා

**පිටකවර නිර්මාණය** : රවීන්ද්‍ර තේනුවර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**විවිධ සහාය** : ඊ. එල්. පෙරේරා, කළමනාකරණ සහකාර I
ආර්. එම්. පී. යූ. රාජකරුණානායක, කළමනාකරණ සහකාර III
මාධවී පෙරේරා, කාර්යාල ආධාරක

# හැඳින්වීම

සෞන්දර්ය අධ්‍යාපනයේ මූලික පරමාර්ථ වන්නේ මිනිසාගේ වින්දන ක්ෂේත්‍රය පෝෂණය කිරීමයි. පුද්ගලයකුගේ ශ්‍රේෂ්ඨත්වය නිරූපණය කරනු වස් ලලිතකලා හදාරා තිබීම අවශ්‍ය අංගයක් බව අතීතයේ සිට පැවත එන කියමනකි. සූසැට කලාවන් ලෙස හඳුනාගෙන තිබුණේ මෙවැනි කලා වර්ගීකරණයට අයත් වූ කලා වේ. සෞන්දර්ය ක්ෂේත්‍රයේ වූ බොහෝ කලා අතුරින් චිත්‍ර, සංගීතය, නර්තනය සහ නාට්‍යය යන තෝරා ගත් විෂයයන් කිහිපයක් පමණක් පාසල් විෂයමාලාවට ඇතුළත් කර ඇත.

දාර්ශනික සිතිවිල්ලක් වූ සෞන්දර්ය පෙරදිග භාරතීය ඇදුරන්ගේ ප්‍රකට විෂයයක් විය. ඒ විග්‍රහ කිරීම් සඳහා නාට්‍ය ශාස්ත්‍රය ගුරු කොට ගත් අතර සෞන්දර්ය වූ කලී කලා කරුවාත්, රසිකයාත් අතුරින් වෙන් වූවක් නොව දෙදෙනා ම අතර ඇතිවන වින්දනමය තත්ත්වයක් ලෙස සැලකීම සාධාරණ ය. සෞන්දර්ය හදාරන්නා තුළ වින්දනය සියුම් ලෙස හා මටසිලිටි ලෙස පෝෂණය කළ යුතු අතර එමඟින් ජන සමාජයට හිතකර මානව භක්තිය හා දයාර්ද්‍ර හදවතක් බිහි කළ හැකි වේ. එමෙන් ම භාවමය තුළනය පිණිස මෙන් ම වින්දන ක්ෂේත්‍රයේ සංවර්ධනය පිණිස සෞන්දර්ය අධ්‍යාපනය ඉවහල් වේ. පංචේන්ද්‍රියන්ට ගෝචර ව අනුගත වන සෞන්දර්ය අධ්‍යාපනයේ අවසන් ඵලය සිත සමඟ සම්බන්ධ වන නිසා එය සෘජුව ම පුද්ගලයාගේ හදවතට බලපායි.

පුද්ගලයාගේ හැදියාව, ශිෂ්ටත්වය හා හදවත පෝෂණය මනුෂ්‍ය පෞරුෂයේ අංගයකි. බුද්ධියේ හා කෞශල්‍යයේ ඉහළ ම දියුණුවක් ලැබුව ද මනුෂ්‍ය භාවයේ පැවැත්ම හා එහි අලංකාරය මෙන් ම සාමකාමී සහජීවනය උදෙසා සෞන්දර්ය අවශ්‍ය වන අතර එමඟින් මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම වැඩිදියුණු කරයි. ජීවිතය වඩාත් අර්ථවත් කිරීම් වස් මනුෂ්‍යත්වය රෝපණය පිණිස සෞන්දර්ය අධ්‍යාපනය මහඟු පිටිවහලක් වේ.

පන්ති කාමරයේ සෞන්දර්ය විෂය ඉගෙන ගන්නා සිසු දරු දැරියන් වෙනුවෙන් මුද්‍රිත මොඩියුල ලැබෙන්නේ ප්‍රථම වරට ය. විචිත්‍ර ලෙස හා ආකර්ෂණීය ව සකස් කර ඇති මෙම අත්‍යවශ්‍ය සෞන්දර්ය මොඩියුල වාරයකට දෙක බැගින් එක් ශ්‍රේණියක් සඳහා මොඩියුල හයක් නිර්දේශිත ය. 21 වන සියවසට අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට හැකි වන සේ සිසු දරු දැරියන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන මෙම මොඩියුලවල ඇති සියලු ක්‍රියාකරකම් සකස් කර ඇත.

**කේ. ජී. අජිත් රූපසේන**
අධ්‍යක්ෂ
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන

## මොඩියුලය I - පරිසරය රසවිඳිමින් චලන නිර්මාණය කරමු

### ක්‍රියාකාරකම් පෙළ ගැස්ම


| | පිටු |
|---|---|
| හැඳින්වීම | 1 |
| ඉගෙනුම් පල හා ඉගෙනුම් අවස්ථා | 2 |
| මොඩියුලය භාවිතයට උපදෙස් | 3 |
| 1. ස්වාභාවික පරිසරයේ සෞන්දර්ය රස විඳිමු | 4 - 8 |
| 2. ජන ගායනා කෘති රස විඳිමු | 9 - 13 |
| 3. සාම්ප්‍රදායික නර්තන රස විඳිමු | 14 - 16 |
| 4. ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හා බැඳි චලන අභ්‍යාස උගනිමු | 17 - 19 |
| 5. ගැමි නැටුම් අංග රස විඳිමු | 20 - 23 |
| 6. පෙරහරක අසිරිය | 24 - 26 |


## මොඩියුලය II - සම්ප්‍රදාය ඇසුරෙන් නිර්මාණ කරමු

### ක්‍රියාකාරකම් පෙළ ගැස්ම


| | පිටු |
|---|---|
| හැඳින්වීම | 28 |
| 1. සරල කැටයම් සහිත සැරසිල්ලක් නිර්මාණය කරමු | 29 - 34 |
| 2. ශරීරයේ කොටස් හඳුනා ගැනීම හා චලන භාවිතය | 35 - 41 |
| 3. තාලාවබෝධය (මාත්‍රා 2 තාලය) | 42 - 45 |
| 4. විකල්ප වාද්‍ය උපකරණ සකසමු | 46 - 49 |
| 5. ඉගෙන ගන්නා ලද ක්‍රියාකාරකම් ඇසුරෙන් ප්‍රසංගයක් සැලසුම් කරමු | 50 - 56 |

# නර්තනය

## පළමු වාරය

### අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුලය - I

# 6 ශ්‍රේණිය

# පරිසරය රසවිඳිමින් චලන නිර්මාණය කරමු



# මොඩියුලය I - හැඳින්වීම

ලෝකය ජය ගැනීමට අධ්‍යාපනය මහත් රුකුලකි. වෙනස් වන සමාජයත් එහි වැදගත්කමත් හඳුනා ගනිමින් තාක්ෂණික යුගයක් කරා යොමු වීමට පන්ති කාමරය පිටිවහලක් වේ. ඒ සඳහා ඔබට මොඩියුලයක් නිර්මාණය වී ඇත. එබැවින් විවිධ ක්‍රියාකාරකම් මගින් ඔබේ හැකියාව හෙළි කරමින් ඉගෙනුමක් කරා ළඟා වීමට මංපෙත් සලසා ඇත. විටෙක ඔබ පන්ති කාමරයේ ද විටෙක අවට පරිසරයේ ද තවත් විටෙක තාක්ෂණික ක්‍රියාකාරකම්හි නියැළීමට ද මෙහි ඉගෙනුම් අවස්ථා සැලසුම් වී ඇත. ඉගෙනීම සතුටින් කිරීමටත් ඉගෙන ගත් දේ සතුටින් භාවිත කිරීමටත් මෙම මොඩියුලය මගින් මංපාදා දෙනු ඇත.



**21වන සියවසේ කුසලතා**

**චින්තනමය කුසලතා**

- විචාරාත්මක බව
- නිර්මාණශීලී බව
- තර්කානුකූල බව
- තීරණ ගැනීම
- ගැටලු විසඳීම

**පෞද්ගලික කුසලතා**

- ව්‍යවසායකත්ව හැකියා
- ආරම්භක හැකියා
- නම්‍යශීලී බව
- වගවීම හා වගකීම
- ස්වයං විනය

**සමාජමය කුසලතා**

- සහානුභූතිව සවන් දීම
- කණ්ඩායම් වැඩ
- සන්නිවේදන හැකියා
- නායකත්වය
- අන්තර් පුද්ගල හැකියා

## මෙම මොඩියුලය මගින් ආවරණය වන ඉගෙනුම් පල හා ඉගෙනුම් අවස්ථා

| ඉගෙනුම් පල | ඉගෙනුම් අවස්ථා |
|---|---|
| ස්වාභාවික පරිසරයේ විවිධ වස්තු හා අවස්ථාවන්හි සුවිශේෂතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ අගය කරයි. | ගස්වැල්, ගංගා, දිය ඇළි, මුහුද හා බැඳි ශබ්ද, නාද, චලන, හැඩතල හා වර්ණ හඳුනා ගනිමින් එහි කලාත්මක ලක්ෂණ අගය කිරීම. |
| ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායන රස විඳිමින් එහි කලාත්මක අගය විස්තර කරයි. | පැල් කවි පතල් කවි හා තෝරා ගත් ළමා ගීතයක භාෂාව, ගායන හා බැඳි වෘත්තීන්හි පසුබිම හඳුනාගෙන එහි කලාත්මක ලක්ෂණ අගය කිරීම. |
| නර්තන අංගයක චලන ස්වභාවය, වාදන හා රංග වස්ත්‍රාභරණවල සුවිශේෂතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ අගයමින් අදහස් දක්වයි. | උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්වලට අයත් නර්තන අංග තුනක චලන, වාද්‍ය භාණ්ඩ රංගවස්ත්‍රාභරණ හා බැඳි කලාත්මක ලක්ෂණ අගය කිරීම. |
| ඉගෙන ගන්නා සම්ප්‍රදායේ නර්තනය හා බැඳි මූලික අංගහාර පිළිබඳ අවබෝධයෙන් නිවැරදි හැඩතල සහිත චලන ප්‍රදර්ශනය කරයි. | නර්තන සම්ප්‍රදාය හා බැඳි මූලික අංගහාරය හඳුනා ගනිමින් ඒවා නිවැරදි ව භාවිත කිරීම හා සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගැනීම සඳහා චලන 3ක් අභ්‍යාස කිරීම. |
| පාසල් ප්‍රසංගයක දක්නට ලැබෙන ගැමි නැටුම් අංගයන්හි කලාත්මක ලක්ෂණ අගය කරයි. | කළගෙඩි හා ලී කෙළි ගැමි නැටුම් හි කලාත්මක ලක්ෂණ අගයමින් අදහස් ඉදිරිපත් කිරීම. |
| ප්‍රදේශයේ පවත්නා පෙරහැරක දක්නට ලැබෙන සංස්කෘතික හා කලාත්මක ලක්ෂණ අගය කරමින් එහි සුවිශේෂතා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ප්‍රදේශයේ පවත්නා පෙරහරක් පැවැත්වීමේ හේතු, චාරිත්‍ර විධි, නර්තන, ගායන, වාදනයන්හි කලාත්මක ලක්ෂණ අගය කරමින් ඒවා පිළිබඳ තොරතුරු රැස් කිරීම |

## මොඩියුලය භාවිතයට උපදෙස්

- මෙම මොඩියුලය ඔබට පමණක් නොවේ. ඔබේ කුඩා සොයුර සොයුරියන් වෙනුවෙන් සුරකින්න.
- මෙම මොඩියුලයේ දී ඇති විවිධ ක්‍රියාකාරකම් ඔබේ සටහන් පොතේ සටහන් කර ගෙන පිළිතුරු සපයන්න. ස්වාධීන ව ක්‍රියාකාරකම්හි නිරත වන්න. අවශ්‍ය විට ගුරු උපදෙස් ලබා ගන්න.
- ක්‍රියාකාරකම්වලට අදාළ සබැඳි භාවිත කිරීමේ දී වැඩිහිටියන්ගේ උපදෙස් ලබා ගන්න.
- කාලය සුදුසු පරිදි කළමනාකරණය කර ගන්න.
- ඔබේ කුසලතා සංවර්ධනය සඳහා සාමූහික හා පෞද්ගලික ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍ය අවකාශය මෙම මොඩියුලය මගින් සපයා ඇත.






## ක්‍රියාකාරකම 01

කාලච්ඡේද 02



# ස්වාභාවික පරිසරයේ සෞන්දර්ය රස විඳිමු

### හැඳින්වීම

ආදරණීය දුවේ, පුතේ ඔයාල ජීවත් වන පරිසරයේ දක්නට ලැබෙන ගස්-වැල්, ගංගා, දිය ඇළි, මුහුද ආදී වස්තූන් හරි ම සුන්දර ය. ඒවායේ ක්‍රියාකාරිත්වය හා එකිනෙක අතර සම්බන්ධය ස්වාභාවිකව ම නිර්මාණය වී ඇත. එම සුන්දරත්වය නරඹා සතුටක් ලැබීමට නම් ඔබට නිදහස් මනසක් සහ විවේක කාලයක් අවශ්‍ය වෙයි.

ස්වාභාවික පරිසරයේ පවතින වස්තූන්වල විවිධ හැඩතල හා වර්ණ ඇත. එම පරිසරයෙන් ඇසෙන ශබ්ද හා නාදවල විවිධත්වය තුළින් ඔබට සතුටක් ලැබීමට හැකිවෙයි. එමෙන් ම වැසි දිනවල දී පරිසරයේ ඇති වන සුළඟ, ගස්වල චලනය, හෙණහඬ, විදුලිය කෙටීම වැනි සිදුවීම් ද අපට විවිධ අවස්ථාවල දක්නට ලැබෙයි.

පරිසරය ඉතා ඕනෑකමින්, ආශාවෙන් නරඹන විට ඔබට අපූරු අත්දැකීම් ලබා ගත හැකි වේ. උදෑසන, සවස, රාත්‍රිය, වියළි-තෙත් ආදි කාලවල දී මොහොතින් මොහොත පරිසරයේ සුන්දරත්වය වෙනස් වන ආකාරය බලා සතුටු වීමට හැකි ය. මෙම ක්‍රියාකාරකමෙන් පරිසරය රසවිඳීමටත්, ජීවත් වීමට පරිසරය වැදගත් වන අයුරු පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමටත් හැකි වෙයි.

## මෙම ක්‍රියාකාරකමින් ...

- ස්වාභාවික පරිසරය රස විඳීමෙන් ඉවසීම, හික්මීම, කැපවීම, ඕනෑකම ආදි ගුණාංග වර්ධනය කර ගැනීමට.
- පරිසරයේ සුන්දරත්වය නැරඹීමට හා නිරීක්ෂණය කිරීමට.
- පරිසරයේ ස්වාභාවික වස්තූන්වල හැඩය, වර්ණය, නැවත නැවත නරඹා සතුටු වීමට
- පරිසරයේ වස්තූන් හඳුනා ගෙන නම් කිරීමට
- එම වස්තූන්හි හැඩතල හා වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම
- පරිසරයෙන් ඇසෙන ශබ්ද හා නාද හඳුනා ගෙන අදහස් ප්‍රකාශ කිරීම
- පරිසර වස්තූන් හා බැඳි විවිධ අවස්ථා පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නට
- පරිසරයේ සෞන්දර්යාත්මක වටිනාකම් අගය කරමින් කතා කරන්නට
- පරිසරයේ කලාත්මක බව ප්‍රකාශ කරමින් නර්තනයක් / ගීතයක් / චිත්‍රයක් / කවියක් ඉදිරිපත් කිරීම
- පරිසරය ජීවිතයට වැදගත් වන අයුරු පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නට.
- පරිසරයේ අසිරිය ඇසුරෙන් නිර්මාණ කිරීමට.

**ඔබට හැකියාව ලැබෙනු ඇත.**

## පියවර 01

- ඔබ කැමති පරිසරයක ඇති ගංගා, දිය ඇළි, ගස්වැල් ආදියනරඹන්න/ මතකයට නගන්න. (මේ සඳහා අන්තර්ජාලයේ වීඩියෝ භාවිත කළ හැකි ය.)
- ඒවායේ හැඩය, වර්ණ, ශබ්ද, නාද, චලන ආදිය නිරීක්ෂණය කරන්න, ඒවා එකිනෙකට බැඳී ඇති අයුරු ගැන හොඳින් සිතන්න. ඒවායේ විවිධ අවස්ථා නිරීක්ෂණය කරන්න.

## පියවර 02

- ස්වාභාවික පරිසරයට සවන්දෙමින් රස විඳීම.

  මේ සඳහා බාහිර ශබ්දවලින් දුරස් වූ නිදහස් ස්ථානයක් තෝරා ගැනීම හෝ ශ්‍රව්‍ය පටයක් භාවිත කළ හැකි ය.

**ඇමුණුම් අංක 01 භාවිත කරමින් ක්‍රියාකාරකමේ යෙදෙන්න.**

ඔබට ගුරුතුමාගේ සහාය ලබා ගත හැකි ය.

පහත සඳහන් වගුවේ **A** කොටසේ ගුරුතුමාගේ උපදෙස් ක්‍රියාවලිය ද, **B** කොටසේ ඔබගේ ප්‍රතිචාරය ද දක්වා ඇත.

## ඇමුණුම් අංක 01

| A - ගුරුතුමා | B - ක්‍රියාවෙහි යෙදෙන ඔබ |
|---|---|
| 1. පරිසරය රසවිඳීමට සුදුසු ස්ථානයක පහසු ක්‍රමයකට සිටීමට උපදෙස් දීම | උපදෙස් අනුව සහභාගි වීම |
| 2. දෑස් පියා ගැනීමට උපදෙස් දීම | උපදෙස් අනුව ක්‍රියා කිරීම |
| 3. ඉතා හොඳින් හුස්ම ගෙන හෙමින් පිට කිරීමට උපදෙස් දීම (කාලය ලබා දෙන්න) | උපදෙස් අනුව ක්‍රියා කිරීම |
| 4. සියලු ශබ්ද හා නාදවලට ඉතා හොඳින් සවන් දෙන ලෙසට උපදෙස් දීම (කාලය ලබා දෙන්න) | උපදෙස් අනුව සහභාගි වීම |
| 5. ගස්වැල්, සුළඟ, දිය ඇළි ආදියෙහි ශබ්ද අසන්නට අවස්ථාව ලබා දී ඒ ඇසුරෙන් ප්‍රශ්න ඇසීම | පිළිතුරු දීම / ප්‍රතිචාර දීම |
| 6. කුරුළු නාද ඇසීමට උපදෙස් දීම | ප්‍රතිචාර දැක්වීම |
| 7. ඇසෙන ශබ්ද හා නාද වෙන් කර හඳුනා ගැනීමට අවස්ථාවක් දීම | ප්‍රතිචාර දැක්වීම |
| 8. දෑස් විවර කරන ලෙසට උපදෙස් දීම | දෑස් විවර කිරීම |

ඇමුණුම් අංක 01 ඇසුරු කර ගනිමින් පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න. **හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදා පිළිතුරු සපයන්න.**

| මට දැන් | | හරි නම් (√) ලකුණ | වැරදි නම් (×) ලකුණ |
|---|---|---|---|
| 01 | පරිසරයෙන් අසන්නට ලැබුණු ශබ්ද හා නාද විවිධාකාර බව ප්‍රකාශ කිරීමට හැකි ය. | | |
| 02 | පරිසරයේ විවිධ ශබ්ද වෙන් කර හඳුනා ගත හැකි විය. | | |
| 03 | ශබ්ද, නාද ශ්‍රවණය කිරීමෙන් සතුටක් ලබා ගත හැකි විය. | | |
| 04 | නරඹන ලද පරිසරය නැවත නිරීක්ෂණය කිරීමට කැමැත්තක් ඇති විය. | | |

## පියවර 03

දුවේ, පුතේ ඔබ ශ්‍රවණය කරන ලද ශබ්ද හා නාද සහිත පරිසරයේ සුන්දරත්වය විඳීමට දැන් ඔබ කැමැත්තෙන් ඇති. ඒ සඳහා ස්වාභාවික පරිසරයේ හැඩතල හා වර්ණ නිරීක්ෂණය කර රස විඳිමු.

- නිවස, ගෙවත්ත, පාසල, උද්‍යානය, කැලය ආදී ඔබට පහසු ම ස්ථානයක් තෝරා ගැනීම ඔබේ පහසුව හෝ කැමැත්ත අනුව සිදු කළ හැකි ය.
- අන්තර්ජාලයෙන් පටිගත කළ දර්ශනයක් ද තෝරා ගැනීමට හැකියාවක් ඇත.
- පහත සඳහන් රූප ද ඔබට යොදා ගත හැකි ය.





ඔබ නිරීක්ෂණය කරන ලද පරිසරය ඇසුරු කර ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**පහත සඳහන් වස්තුන් හා අගයන් එකිනෙකට ගළපා සටහන් කරන්න.**

| වස්තුන් | අවස්ථා |
|---|---|
| ගස් | මාදැල් ඇදීම<br>රළමත ලිස්සා යාම |
| මුහුද | ලී කැටයම්<br>ගෘහ උපකරණ සෑදීම |
| දිය ඇළි/ගංගා | ජල විදුලි නිෂ්පාදනය<br>උද්‍යාන අලංකරණය |

- මෙම ක්‍රියාකාරකම ඔබගේ ජීවිතයට වැදගත් වන ආකාරය වාක්‍ය 2කින් කෙටියෙන් ලියන්න.
- මෙය ඇසුරු කර ගෙන ගුරුවරයා සාකච්ඡාවක් මෙහෙයවනු ඇත.

## පියවර 04

### ඔබ ඉතා හොඳින් නැරඹිය යුතු දේවල්

- ගස්වැල්වල පිහිටීම, චලනය, එහි පිළිවෙළ, ඒවායේ කඳ, අතු, කොළ, දලු, මල්, ගෙඩි ආදියේ හැඩය (උදා - දිගටි බව, මහත බව, රවුම් බව, සිහින් බව) ඒවායේ එක් එක් පාට හා ලස්සන බලන්න.
- දිය-ඇළි, ගංගා, ඇළ-දොළ, වැව්-පොකුණු ආදියෙහි හැඩය හා එහි තැනින් තැන ඔබට පෙනෙන පාට හා ලස්සන නරඹන්න.
- එම වස්තුන්හි දක්නට ලැබෙන විවිධ අවස්ථා (සෙලවීම, කැරකීම, ගලා යෑම) නරඹන්න.
- නරඹන ලද පරිසරය ඇසුරු කර ගනිමින් කණ්ඩායම්වලට බෙදී පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

1. පරිසරයේ වස්තුන් පහක් නම් කර එවායේ ශබ්ද නාද චලන හැඩතල වර්ණ පිළිබඳ තොරතුරු කෙටියෙන් විස්තර කරන්න.

2. පරිසරය ඇසුරෙන් කතාවක්/ගීතයක්/නර්තනයක්/චිත්‍රයක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න.

## පියවර 05

### ස්වයං තක්සේරුව - B

**ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.**

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | පරිසරයේ වස්තුන් හඳුනා ගෙන නම් කිරීම | | | | |
| 2 | එම වස්තුන්හි හැඩතල හා වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම | | | | |
| 3 | පරිසරයෙන් ඇසෙන ශබ්ද හා නාද හඳුනා ගෙන අදහස් ප්‍රකාශ කිරීම | | | | |
| 4 | පරිසරයේ කලාත්මක බව ප්‍රකාශ කරමින් නර්තනයක්/ගීතයක්/චිත්‍රයක්/කවියක් ඉදිරිපත් කිරීම | | | | |
| 5 | සතුටින් හා කණ්ඩායමේ සහභාගිත්වයෙන් ඉදිරිපත් කිරීම | | | | |
| 6 | ජීවත් වීමට පරිසරය වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම | | | | |

ක්‍රියාකාරකම 02

කාලච්ඡේද 02

# ජන ගායන කෘති රස විඳිමු





**හැඳින්වීම**

දුවේ, පුතේ ඔබ අසා ඇති ජන ගී කීපයක් මතක ද? ජන ගී රස විඳීමේ දී එහි භාෂාව, නාදමාලාව, අදහස පිළිබඳ සැලකිල්ලෙන් බැලිය යුතු වේ. ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ජන ගායන බොහොමයක් අප සතු ව පවතී. ජීවත් වන පරිසරය අනුව අප එකිනෙකාගේ සිතුම් පැතුම්, ආකල්ප, ගතිපැවතුම්, ජීවන වෘත්තීන් විවිධාකාර වේ.

ගැමි ජනයාගේ ජීවන ස්වභාවය ගැමි ගායනවලින් ඉදිරිපත් කෙරෙයි. පැල් කවි හා පතල් කවි නිර්මාණය වී ඇත්තේ ඔවුන්ගේ ජීවන වෘත්තීන් පදනම් කර ගෙන ය. ගැමි ජනතාවගේ සිතට දැනෙන පාළුව, ගතට දැනෙන විඩාව මගහරවා ගැනීමට මෙම ජනකවි ගායන කර ඇත. එම ගායන තුළින් ඔවුන් නිරත වන කාර්යයන්වල විවිධ අවස්ථා නිරූපණය වේ.

ගායනවලින් කියැවෙන ගැමි ජනයාගේ එබඳු හැඟීම් අපට විවිධ චලන භාවිත කරමින් ඉදිරිපත් කළ හැකි ය. ඒ සඳහා විවිධ රූප රාමු, ශ්‍රව්‍ය-දෘශ්‍ය පට නැරඹීමෙන් හා ඒවා රස විඳීමෙන් ඔබට යම් සහායක් ලබා ගත හැකි ය.

### මෙම ක්‍රියාකාරකමින් ...

ජීවන වෘත්තීන් හි ස්වභාවයන් පැල් හා පතල් කවි ගායනා මගින් ප්‍රකාශ වන බවට අදහස් ඉදිරිපත් කිරීමට.

- තේමා මුල් කර ගෙන පැල් හා පතල් කවි නිර්මාණය වී ඇති බව හඳුනා ගැනීමට .
- පැල් හා පතල් කවි ගායනා කරන ස්වභාවය හඳුනා ගෙන රස විඳීමට .
- හැඟීම් ප්‍රකාශනය සඳහා සරල චලන ඉදිරිපත් කිරීමට
- ජන ගායනා මගින් ගැමිජීවිතයේ ස්වභාවයන් විස්තර කෙරෙන බව ප්‍රකාශ කිරීමට.
- පැල් හා පතල් කවි රස විඳිමින් එහි අදහස ඇසුරෙන් නිර්මාණ කිරීමට. ඔබට හැකියාව ලැබෙනු ඇත.

### පෙර පිරික්සුම

නිවසේ දී ඔබ පහත දැක්වෙන චිත්‍රය හොඳින් නරඹා දී ඇති ප්‍රශ්න අභ්‍යාස පොතේ සටහන් කර ගෙන පිළිතුරු සපයන්න.



1. මෙම චිත්‍රයේ ඔබ සිත් ගත් දේවල් තුනක් ලියන්න.
2. මෙම චිත්‍රයේ ඔබ දුටු වර්ණ මොනවා ද?
3. චිත්‍රය ඔබගේ සිත් ගැනීමට ඉහත සඳහන් කළ වර්ණ හේතු වී ඇත් ද?
4. චිත්‍රය ලස්සන කර ගැනීමට වර්ණ හැරුණු කොට යොදා ගෙන තිබූ වෙනත් දේවල් මොනවා ද?
5. වර්ණ, රේඛා, හැඩතල ජීවී-අජීවී වස්තු තුළින් මෙම චිත්‍රය අලංකාර වී ඇති බව ඔබ පිළිගන්නේ ද?

## පියවර 01

- පැල් කවියක් හෝ සුදුසු ගීතයක් ශ්‍රවණය කරන්න. ගුරු උපදෙස් ලබාගන්න.
- කවිය/ ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඔබේ අභ්‍යාස පොත භාවිත කරන්න.

1. එම කවියෙන්/ ගීතයෙන් අදහස් කෙරෙන අවස්ථාවක් ඉදිරිපත් කරන්න.

## පියවර 02

- පැල් කවි පතල් කවි ඇතුළත් ශ්‍රව්‍ය-දෘශ්‍ය පටය කිහිප වතාවක් දැස් පියා ගෙන හොඳින් ශ්‍රවණය කරන්න.
- පහත සඳහන් කරුණු ගැන සිතමින් කිහිප වරක් එම කවි රස විඳින්න.
  - කවිවල යොදා ඇති වචන
  - කවිවල තාලය
  - නාදමාලාව
- කවිවලින් කියැවෙන අදහස/ ප්‍රකාශනය
- එම කවි ඇසෙන විට ඔබේ හිතට දැනෙන දේ පිළිබඳ අවධානය යොමු කරන්න.

## පියවර 03

ඔබ හොඳින් සවන් දී රස විඳි ජන කවි ඇසුරින් පහත සඳහන් ප්‍රකාශ පොතේ සටහන් කරගෙන හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

1. ඔබ ඇසූ ජන කවිවල වචන ඉතා සරල ය. (........)
2. මෙම කවි ඔබට ඇසෙන විට සිතට සතුටක් දැනෙයි. (........)
3. මෙම කවි අසන විට ගැමි පරිසරයක් සිතේ මැවේ. (........)
4. ජීවන වෘත්තීන් දෙකක් පිළිබඳ මෙම කවි දෙකෙන් විස්තර වෙයි. (........)
5. මෙම කවිවල නාද මාලාවන්හි වෙනස්කම් ඇත. (........)

## පියවර 04

- ගුරුවරයා සමග එක් ව හැඟීම් ප්‍රකාශ කරමින් එම කවි ගායන කරන්න. (Channel NIE Youtube) පැල්, පතල්, ජන ගායනා වැඩසටහන නරඹන්න.)
- කණ්ඩායම් දෙකකට බෙදී ඇමුණුම 01 හා 02 උදව්වට ගෙන ගුරුවරයා සමග කවි ගායනයට යොමු වන්න.

- කවිය ගායන කිරීමේ දී දැනෙන හැඟීම් මුහුණේ ඉරියවු, සරල චලන මගින් ප්‍රකාශ කිරීමට උත්සහ කරන්න.
- එක් කණ්ඩායමක් කවි ගායන කරමින් විවිධ චලන මගින් ප්‍රකාශන ඉදිරිපත් කරන්න.
- අනෙක් කණ්ඩායම එය හොඳින් ශ්‍රවණය කරමින් නරඹා ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න.
- කණ්ඩායම් දෙක මාරු වෙමින් මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම හා ජන කවිවල ඇති වටිනාකම සාකච්ඡා කර එක් එක් කණ්ඩායම විසින් සරල ව අදහස් ඉදිරිපත් කරන්න.

**A කොටසට වඩා ගැළපෙන වාක්‍ය කණ්ඩය B කොටසින් තෝරා ලියන්න.**

| A | B |
|---|---|
| 1. කවි ගායන කිරීමෙන් | කවියෙන් ප්‍රකාශ වේ. |
| 2. කවි ගායනවල වචන | තාල තැබිය නොහැකි ය. |
| 3. කවියේ අර්ථය ප්‍රකාශනය සඳහා | සතුටක් ලැබුණි. |
| 4. ජන ජීවිතයේ අවස්ථා | නාදමාලාවෙන් මතුකර පෙන්වයි. |
| 5. ගායනවල විවිධත්වය | සරල ය. |
| 6. පැල්, පතල් කවි ගායනයේ දී | මුහුණේ ඉරියවු හා චලන භාවිතයට ගැනෙයි |

**ඇමුණුම 01**

**පැල් කවි**

1. ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

2. පෙර කාලේ තැනූ පැල දැන් දිරාලා
එම කාලේ බැඳපු වැට ගොනු කඩාලා
පැලපතේ ගොයම් රෑ රැක බලාලා
නිදිමතේ කියමු පැල් කවි ගොතාලා

ඇමුණුම 02

**පතල් කවි**

1. ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලෙ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදා ද මවුපියො දකින්නට

2. දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ
රට වෙඩි දමා කඩනා කළු ගල් කැටියේ
මඩ යට තියෙන මිණිරන් ගන්නා සැටියේ
උඩ වැඩ කරන අයට දෙන්නේ අඩු පඩියේ

ඔබ මෙතෙක් ඇසූ කවි දෙක නැවතත් හොඳින් ශ්‍රවණය කර එම කවිවල අදහස මතු වන පරිදි චිත්‍රයක් අඳින්න. එම චිත්‍රය පිළිබඳ ඔබගේ අදහස් පන්තියට ඉදිරිපත් කරන්න.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | පැල් හා පතල් කවි නම් කිරීම. | | | | |
| 2 | කවිවල භාවිත වචන හා අර්ථය පිළිබඳ විස්තර කිරීම, | | | | |
| 3 | ජන ගායනවල සමාජීය වටිනාකමක් ඇති බව ප්‍රකාශ කිරීම. | | | | |
| 4 | පැල් හා පතල් කවිවලින් කියවෙන ස්වාභාවික පරිසරයේ සුන්දරත්වය විස්තර කිරීම | | | | |
| 5 | හැඟීම් ප්‍රකාශ වන පරිදි ජන ගායන ඉදිරිපත් කිරීම. | | | | |

# ක්‍රියාකාරකම 03

කාලච්ඡේද 02

## සාම්ප්‍රදායික නර්තන රස විඳිමු

### හැඳින්වීම

දුවේ, පුතේ තනුලයි රවීෂායි කියන කතාව අහමු ද?

තනුල - මම ඊයෙ ලස්සන ප්‍රසංගයක් බලන්න ගියා.....

රවීෂා - ආ...... ප්‍රසංගයක්....මොන ප්‍රසංගයක් ද තනුල?

තනුල - නර්තන ප්‍රසංගයක්..

රවීෂා - ෂා! ලස්සනයි ද ඒකෙ තිබුණු නැටුම්....?

තනුල - ඔව්... හරි ම ලස්සනයි... එක එක වර්ගයේ නැටුම් තිබුණා...

රවීෂා - එක එක වර්ගයේ නැටුම් කිව්වේ...?

තනුල - උඩරට නැටුම්, පහතරට නැටුම්, සබරගමු නැටුම්.... තමයි

රවීෂා - ආ.. ඒ කියන්නෙ සාම්ප්‍රදායික නැටුම්...

තනුල - ඔව්, ඔව්.. සාම්ප්‍රදායික නැටුම්..මටත් ආස හිතුණා ඒ විදිහට නටන්න. හස්ත පාද චලනය කරමින් අත් දිහා බලමින් ලස්සනට හිනා වෙලා තමයි නැටුවෙ. අපි හරි සතුටෙන් නැටුම් බැලුවෙ. බෙර වාදනයට අනුව කවිවලට නැටුව හැටි මට තාමත් මැවිලා පේනවා....

රවීෂා - අනේ...! මටත් බලන්න තිබුණ නම්... දැන් අපි ඒ ක්‍රියාකාරකම කරන්නයි යන්නෙ

**මෙම ක්‍රියාකාරකමින් ...**

- දේශීය නර්තන සම්ප්‍රදායන් වෙන් කර දැක්වීමට.
- එම නර්තන සම්ප්‍රදායේ දී චලන ස්වභාවය, වාද්‍ය භාණ්ඩ හඳුනා ගෙන අදහස් ප්‍රකාශ කිරීමට.
- සාම්ප්‍රදායික නර්තනවල කලාත්මක ලක්ෂණ අගය කරන්නට.
- ඒ ඒ සම්ප්‍රදායන්හි රංග වස්ත්‍රාභාරණවල වර්ණ, හැඩතල පිළිබඳ විස්තර කරන්නට
- සාම්ප්‍රදායික නර්තනාංග ආරක්ෂා කිරීම සඳහා නව යෝජනා ඉදිරිපත් කිරීමට.

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## පියවර 01

ගුරුවරයා විසින් ලබා දෙන සම්ප්‍රදාය තුනට අයත් නර්තනාංග නරඹන්න. ඒ එක් එක් සම්ප්‍රදායන්හි වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කරන්න. නර්තනාංග හා සබැඳි චලන ස්වභාවය, වාදන, රංග වස්ත්‍රාභරණවල සුවිශේෂතා පිළිබඳ ව ගුරුවරයා සමග සාකච්ඡා කරන්න.

**(අ) කොටසට වඩාත් සුදුසු වරණය (ආ) කොටසින් තෝරා ලියන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 1. නර්තනයේ මූලික ඉරියව්ව | සතුටකි. |
| 2. ඔබ නරඹන ලද නර්තනාංග | සමාන නොවේ. |
| 3. නර්තනය නැරඹීමෙන් අපට ලැබුණේ | කැමති ය. |
| 4. දක්නට ලැබුණු අංගහාර හා හැඩතල | මණ්ඩිය වේ. |
| 5. අප එවැනි සාම්ප්‍රදායික නර්තනාංග රස විඳීමට | සාම්ප්‍රදායික නර්තන වේ. |

මෙම ක්‍රියාකාරකම ඇසුරෙන් ගුරුවරයා ඔබට අවශ්‍ය උපදෙස් ලබා දෙනු ඇත.

## පියවර 02

- නරඹන ලද දර්ශන පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- එහි දී සාම්ප්‍රදායික නර්තනාංගවල වෙනස්කම් හඳුනා ගන්න.
- සාම්ප්‍රදායික නර්තනාංග නැරඹීම මගින් සතුටක්, මානසික සුවයක් ලබා ගැනීමට හැකි වෙයි.

01. ඔබ නරඹන ලද නර්තන අංග නැවත නරඹා මතකයට නගා ගන්න.

02. ගුරුවරයා සමඟ සාකච්ඡා කර සම්ප්‍රදායන්හි චලන, වාද්‍ය භාණ්ඩ වෙන වෙන ම හඳුනා ගනිමින් රස විඳින්න.

    - නර්තන සම්ප්‍රදායන්ගේ නිවැරදි හැඩතල හා අංගහාර පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාගන්න. සුවිශේෂ හැඩතල හා චලන කීපයක් පංතියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා ගන්න.

03. රංග වස්ත්‍රාභරණවල, වර්ණ හා හැඩතලයන්හි කලාත්මක ලක්ෂණ හා සුවිශේෂතා පිළිබඳ ගුරුවරයා සමග සාකච්ඡා කරන්න.

## පියවර 03

නැරඹීමට ලබා දුන් දර්ශනය මතකයේ තබා ගනිමින් පහත ක්‍රියාකාරකමේ යෙදෙන්න.

**පහත සඳහන් ක්‍රියාකාරකම් සටහන් පොතේ සටහන් කරන්න.**

01. පහත ඇති **A B C** රූපවලට අදාළ නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.



**A**



**B**



**C**

## පියවර 04

**දුවේ පුතේ** ඔබ නැරඹූ නර්තන අංග ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .

1. සාම්ප්‍රදායික නර්තන පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.
2. සාම්ප්‍රදායික නර්තනාංග නරඹා රස විඳීමට ඇති කැමැත්ත පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න.

ගුරුවරයා සමග සාකච්ඡාවක නිරත වී දැනුම ලබා ගන්න.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | එක් එක් නර්තන සාම්ප්‍රදායන් හඳුනාගැනීම | | | | |
| 2 | එම සම්ප්‍රදායන්හි චලන හා රංග වස්ත්‍රාභරණ හඳුනාගෙන ඒ පිළිබඳ අදහස් දැක්වීම. | | | | |
| 3 | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩවල සුවිශේෂතා හඳුනාගෙන අදහස් ඉදිරිපත් කරන්නට | | | | |
| 4 | සාම්ප්‍රදායික නර්තනාංගවල කලාත්මක ලක්ෂණ අගය කිරීම | | | | |
| 5 | සාම්ප්‍රදායික නර්තනාංග ආරක්ෂා කර ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම. | | | | |

**ක්‍රියාකාරකම 04**

කාලච්ඡේද 02

# ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හා බැඳි චලන අභ්‍යාස උගනිමු

**හැඳින්වීම**

දුවේ, පුතේ, අපි විවිධ දේ රස විඳල අත්දැකීම් ලබා ගත්තා. දැන් ඉගෙන ගන්නා නර්තන සාම්ප්‍රදායට අදාළ චලන කිහිපයක් කරන්නයි සූදානම් වෙන්නෙ. පාසලේ දී ඔබ හදාරණ නර්තන සම්ප්‍රදායට අයත් සාම්ප්‍රදායික නර්තන වීඩියෝ දර්ශනයක් හෝ රූප කිහිපයක් නරඹමින් රස විඳ එහි ඇති චලන අභ්‍යාස තුනක් ඉගෙන ගනිමු. මෙම පාඩම තුළින් ඔබ හදාරණ නර්තන සම්ප්‍රදායේ අංගහාර නිවැරදි ව සකස් කර ගැනීම සඳහා චලන තුනක් අභ්‍යාස කිරීමටයි සූදානම් වෙන්නෙ.

**මෙම ක්‍රියාකාරකමින් ...**

- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාරය තෝරා ගෙන ප්‍රදර්ශනය කිරීමට
- සාම්ප්‍රදායික නර්තන හා සබැඳි චලන, හැඩතල ප්‍රදර්ශනය කරන්නට.
- සාමූහික ව චලන ඉදිරිපත් කරන්නට.
- සම්ප්‍රදාය හා බැඳි චලන පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට.
- බෙර වාදනයට අනුව චලන කරමින් සතුටු වන්නට.

**ඔබට හැකියාව ලැබෙනු ඇත.**

## පියවර 01

01. ඔබ ඉගෙන ගන්නා නර්තන සාම්ප්‍රදායට අදාළ සාම්ප්‍රදායික නර්තනාංගය නරඹන්න.
02. එම නරඹන ලද නර්තන අංගයේ නිවැරදි හැඩතල හා අංගහාර පිළිබඳ ගුරුවරයා සමග සාකච්ඡා කරන්න.
03. නැරඹීමෙන් අනතුරු ව ක්‍රියාකාරකම සඳහා යොමු වෙන්න.

පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

1. නර්තන අංගයේ පැනීම් කැරකීම් දක්නට ලැබුණි. (............)
2. හස්ත චලන හා පාද චලන අතර සම්බන්ධයක් තිබුණි. (............)
3. විවිධ පැතිවලට හස්ත චලනය සිදුවිය. (............)
4. චලනවල විවිධත්වයක් දක්නට ලැබුණි. (............)
5. තාලානුකූල ව චලන සිදු නොවුණි. (............)

## පියවර 02

නරඹන ලද දර්ශන පිළිබඳ ව සාකච්ඡා කරන්න. එහි දී සාම්ප්‍රදායික නර්තනාංගවල සුවිශේෂතාව පැහැදිලි කර ගන්න. සාම්ප්‍රදායික නර්තනාංග නැරඹීම තුළින් චලන ග්‍රහණය කළ හැකි බව ගුරුවරයා සමග සාකච්ඡා කරන්න. එහි දී නිවැරදි හැඩතල, අංගහාර ආදී දුටු දේ පිළිබද ව අදහස් දක්වන්න.

## පියවර 03

1. පන්තියේ එක් එක් සිසුන් තෝරා ගත් චලන ගුරුවරයා ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
2. ගුරුවරයා සමග එකතු වී ඒ අතරින් සුදුසු චලන තුනක් තෝරා ගන්න.
3. තෝරා ගත් චලන තුන වෙන් වෙන් වශයෙන් අභ්‍යාස කරන්න.
4. ගුරුවරයා බෙරය වාදනය කරන විට ක්‍රියාකාරකම කරන්න. අංගහාර දුටු දේ පිළිබඳ ව අදහස් දක්වන්න.

## පියවර 04

**තෝරා ගත් චලන වෙනත් ක්‍රමයකට අභ්‍යාස කරමු.**

01. පන්තියේ සිටින සිසුන් සියලු ම දෙනා පේළි දෙකකට සැදී තම යහළුවා සමග මුහුණට මුහුණ බලා සිටින්න.
02. එක් සිසුවකු කණ්ණාඩිය ලෙස ක්‍රියා කරන්න.
03. අනෙක් සිසුවා කණ්ණාඩිය ඉදිරියේ සිටින ලෙස ක්‍රියා කරන්න.
04. ඔබ පුහුණු කරනු ලබන චලන තුන කණ්ණාඩිය ලෙස ක්‍රියාකරන සිසුවා ඉදිරියේ කර පෙන්වන්න.
05. කණ්ණාඩිය ලෙස ක්‍රියා කරන සිසුවා කණ්ණාඩියේ පෙනෙන දෙය ලෙස ක්‍රියා කරන්න. එවිට අප කණ්ණාඩියක් ඉදිරියේ නර්තනය කරනවා සේ පෙනෙනු ඇත.
06. ගුරු උපදෙස් මත ක්‍රියා කරන්න.
07. බෙර වාදනයට අනුව චලන සිදු කරන්න.

ගුරු උපදෙස් අනුව කණ්ඩායම් 3කට බෙදී එක් කණ්ඩායමක් නර්තනය කරන විට අනෙක් කණ්ඩායම් 2 තක්සේරුකරණයේ යෙදෙන්න. මේ ආකාරයට සෑම කණ්ඩායමක් ම චලන 3ක් ඉදිරිපත් කිරීමට හා තක්සේරුකරණයට යොමු වන්න.

★ පහත සඳහන් ඇමුණුම් අංක 01 අභ්‍යාස පොතේ සටහන් කර ගෙන පද නර්තනයේ දී අංගහාර භාවිතය නිවැරදි නම් අදාළ තීරුවේ (√) ලකුණ ද අඩුපාඩු සහිත නම් (×) ලකුණ ද යොදන්න.

★ මේ සඳහා ගුරුවරයාගේ සහාය ඔබට ලබා ගත හැකි ය. මෙම ඇගයුම් සටහන කණ්ඩායමේ සමාජිකයන් සමග ද සම්පූර්ණ කළ හැකි ය.

ඇමුණුම් අංක 01

| ක්‍රියාකාරකම | පාද චලන | හස්ත චලන | තාලානුකූල ව චලන කිරීම | සමස්ත නිමාව |
|---|---|---|---|---|
| පළමු අභ්‍යාසය | | | | |
| දෙවන අභ්‍යාසය | | | | |
| තුන්වන අභ්‍යාසය | | | | |

ගුරුවරයා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනයක් කරනු ඇත.

- සියලු කණ්ඩායම් නර්තනය කිරීමේ දී හස්ත පාද හැසිරවීමේ නිවැරදි බව
- තාලානුකූල ව චලන ඉදිරිපත් කිරීම
- අවකාශය නිසි ලෙස භාවිත කිරීම
- සාම්ප්‍රදායික අංගහාර හැඩතල භාවිත කිරීම

## පියවර 05

- පහත දී ඇති වගුව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගෙන ස්වයං තක්සේරුවක නිරතවන්න. අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | චලන තුනක් හඳුනා ගෙන ඉදිරිපත් කිරීම | | | | |
| 2 | චලන තුන පිළිබඳ අදහස් දැක්වීම | | | | |
| 3 | නිවැරදි අංගහාර සහිත ව චලන ඉදිරිපත් කිරීම | | | | |
| 4 | බෙර වාදනය අනුව චලන ඉදිරිපත් කිරීම | | | | |
| 5 | කණ්ඩායමක් සමග චලන ඉදිරිපත් කිරීම | | | | |
| 6 | අනෙක් සිසුන්ගෙන් උපදෙස් ගෙන චලන නිවැරදි කරගැනීම | | | | |

### ඉදිරි පෝෂණය

- රූප සටහන් හෝ රූපවාහිනියේ දක්නට ලැබෙන නර්තන අංග නරඹා සාම්ප්‍රදායික චලන තෝරා ගෙන විවිධ නර්තන නිර්මාණකරණයට යොමු වන්න. එම නිර්මාණ ගුරුවරයාට ඉදිරිපත් කර උපදෙස් ලබා ගන්න.

## ක්‍රියාකාරකම 05

කාලච්ඡේද 02

# ගැමි නැටුම් අංග රස විඳිමු (කළ හා ලී කෙළි නැටුම් අංග)

### හැඳින්වීම

දුවේ, පුතේ, ඔබ කුඩාකල සිටම ගැමි නැටුමකට සහභාගී වෙන්න ඇති. මෙම ගැමිනැටුම් සෑම රටකම දක්නට ඇත. එකී සෑම නර්තනයක්ම තම රටට ආවේණික ලක්ෂණ සහිත ව නිර්මාණය වෙයි.

ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගැමි නැටුම පරිසරය, ආගම හා ජීවන වෘත්තීන්, විනෝදාස්වාදය සමඟ බැඳී පවතී. එදා ගැමියා තම එදිනෙදා කටයුතු සාමූහිකත්වයෙන් හා සතුටින් ඉටුකර ගැනීමට පෙළඹී ඇත.

ගැමි නැටුම් බිහිවීමට ඉහත සියලු කරුණු බලපා ඇත.

මෙම පාඩම තුළ දී නම් කරන ලද ලී කෙළි නැටුම් හා කළගෙඩි ගැමි නැටුම් නරඹීමෙන් එම නැටුමේ ප්‍රාසංගිකත්වය, එය ඉදිරිපත් කරන අවස්ථා හා විශේෂ ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලැබේ. ලී කෙළි නැටුම් නිර්මාණ වී ඇත්තේ පැරණි සටන් කලා අභ්‍යාසය පදනම් කර ගනිමින් බවට සමාජයේ මතයක් ඇත. කළගෙඩි නැටුම විනෝස්වාදය මුල් කර ගනිමින් නිර්මාණය වී ඇත.

ඒ අනුව, මෙම නර්තන රස විඳීමෙන් ඔබට ගැමි සමාජයේ ජීවන වෘත්තීන් පිළිබඳ ව අවබෝධ කර ගත හැකි ය. එමෙන් ම ඔවුන්ගේ ජන ජීවිතයේ සමීප ලක්ෂණ නර්තනයට ද සම්බන්ධ කර අලංකරණයක් එකතු කරගෙන ඇති බව ද පැහැදිලි වෙයි.

**ගැමි නැටුම් තුළ ආවේණික ලක්ෂණ කිහිපයක් ඇත.**

- සරල චලන භාවිතය
- ගැමි නැටුමට අදාළ උපකරණය භාවිතය
- සාමූහිකත්වය හා එකමුතුකම
- සරල නාදමාලා තිබීම
- ඇඳුම් පැළඳුම් සරල වීම

### මෙම ක්‍රියාකාරකමින් ...

- ගැමි නැටුම් නම් කිරීමට
- නරඹන ලද ගැමි නැටුම්වල සරල චලන තිබෙන බව ප්‍රකාශ කිරීමට
- ගැමි නැටුම් සඳහා උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නට
- රංග වස්ත්‍ර හා ගායන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නට
- නරඹන ලද ගැමි නැටුම්වල චලන, රංග උපකරණ, රංග වස්ත්‍ර, රංග රටා තුළින් මතු වන සුන්දරත්වය රස විඳීමට
- සාමූහික ව කටයුතු කිරීමෙන් සුන්දර නිර්මාණයක් කළ හැකි බව ප්‍රකාශ කරන්නට

**ඔබට හැකියාව ලැබෙනු ඇත.**

### පෙර සූදානම

කළගෙඩි, ලී කෙළි, ගැමි නැටුම් අංග ඇතුලත් පිංතූර රැගෙන එන්න.
හැඳින්වීම තුළින් දැන ගත් කරුණු ඇසුරෙන් ක්‍රියාකාරකමට යොමු වෙමු.

## පියවර 01

- ගැමි නැටුම්වල අවස්ථා ඇතුළත් ඡායාරූප කිහිපයක් පහත දැක්වෙයි.
- **A, B, C, D** ලෙස නම් කර ඇති ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න.



A



B



C



D

## පියවර 02

එක් එක් ඡායාරූපයට අයත් ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ගැමි නැටුමේ නම ලියන්න.

නිරත වූ ක්‍රියාකාරකමෙන් පසු ව ගුරුවරයා පහත කරුණු ඔස්සේ කෙටි සාකච්ඡාවක් මෙහෙයවනු ඇත.

- ගැමි නැටුම්වල ආරම්භය
- විවිධ ගැමි නැටුම් වර්ග
- ගැමි නැටුම්වල ලක්ෂණ
- භාවිත කරන චලන

මෙය ඔබේ අදහස් ඉදිරිපත් කිරීමට ද අවස්ථාවක් කර ගන්න.

## පියවර 03

ක්‍රියාකාරකම් 01 හා 02 ට පසුව කළ ගෙඩි හා ලී කෙළි නර්තනය අංගයක දෘශ්‍ය පටයක් ගුරුවරයා විසින් නැරඹීමට සලස්වනු ලබයි.

(කළ ගෙඩි/ ලී කෙළි නර්තන ඇතුළත් ගැමි නැටුම් අංගයක් අන්තර්ජාලය ඔස්සේ බාගත කරගන්න.)

නැරඹීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- චලන ඉදිරිපත් කරන ආකාරය
- කවි ගායනය
- වාදනය සපයන භාණ්ඩ
- රංග උපකරණ භාවිතය
- ඇඳුම් පැළඳුම්
- වේදිකාව භාවිත කරන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.

## පියවර 04

නැරඹූ දෘශ්‍ය පටය ආශ්‍රයෙන් පහත සඳහන් සිසු ක්‍රියාකාරකමට අදාල වගුව සටහන් පොතේ සටහන් කරගෙන සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න. සිසුන් තනි තනි ව ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**සිසු ක්‍රියාකාරකම**

| | ලී කෙළි නැටුම | කළ ගෙඩි නැටුම |
|---|---|---|
| නර්තනය සඳහා අතට ගනු ලබන උපකරණය, ඒවා භාවිතය හා චලන භාවිතය | ........................................ ........................................ ........................................ | .................................. .................................. .................................. |
| නර්තනය සඳහා අඳිනු ලබන ඇඳුම් හා ආභරණ | ........................................ ........................................ | .................................. .................................. |
| නර්තනයට වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ | ........................................ ........................................ | .................................. .................................. |
| කවි ගායනයේ ඇතුළත් පද පේළියක් | | |
| වේදිකාව මත නිර්මාණය කළ රටා දෙකක් අඳින්න | | |
| කළ ගෙඩි/ ලී කෙළි නර්තනවල අලංකාරය ඉස්මතු වීමට බලපෑ හේතු | ........................................ ........................................ | .................................. .................................. |

ක්‍රියාකාරකමට අදාළ ව ගුරුවරයා විසින් සාකච්ඡාවක් මෙහෙයවනු ඇත. ඔබ නැරඹූ දෘශ්‍යපටවල ඇතුළත් ගැමි නැටුම් හි සිත්ගත් දේ විස්තර කරමින් ගුරුවරයාගේ සාකච්ඡාවට සහභාගි වන්න.

සිසුන් කණ්ඩායම් වී නරඹන ලද දෘශ්‍යපටය ඇසුරින් නර්තන කොටසක් (චලන දෙකක්) නිර්මාණය ඉදිරිපත් කරන්න.

## පියවර 05

- පහත සඳහන් වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | ගැමි නැටුම් අංග නම් කිරීම | | | | |
| 2 | රංග උපකරණ නම් කිරීම | | | | |
| 3 | ගැමි නර්තන හා බැඳි ගායන හා වාදන පිළිබඳ විස්තර කිරීම | | | | |
| 4 | රංග වස්ත්‍රාභරණ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම | | | | |
| 5 | නර්තන කොටසක් (චලන දෙකක්) නිර්මාණය කිරීම. | | | | |

# පෙරහරක අසිරිය

## හැඳින්වීම

ආදරණීය දුවේ පුතේ,"පෙරහර බලන්න යමු" කීවොත් ඔයාලගේ සිත කොයි තරම් නම් සතුටු වෙනවා ද? පන්සල ,පල්ලිය, කෝවිල ආදී පූජනීය ස්ථානයන් හි දී ඔබට පෙරහර දැකගත හැකි වෙයි.

ඔබ දැක ඇති පෙරහරක් මතකයට නඟා ගන්න. පෙරහර ශ්‍රී ලාංකික අපේ සංස්කෘතික අංගයකි. නර්තන, ගායන, වාදන හා සැරසිලි වැනි කලාත්මක ලක්ෂණ බොහොමයක් පෙරහරක දක්නට ලැබේ.

දිගු ඉතිහාසයක් මෙන් ම ඓතිහාසික වටිනාකමක් ද ඇති පෙරහරේ කලාත්මක අගය හඳුනා ගැනීම වැදගත් වේ. එහි සංස්කෘතික හා ඓතිහාසික වටිනාකම ඉදිරි අනාගතයට ද සුරක්ෂිත කර දීමට පුංචි ඔබේ සිතුවිලි ශක්තිමත් කිරීම සඳහා සූදානම් වෙමු.

**මෙම ක්‍රියාකාරකමින් ...**

- ප්‍රදේශයේ පවත්නා පෙරහරක් නම් කරන්නට
- පෙරහර පැවැත්වීමේ හේතු හා එහි චාරිත්‍ර විධි විස්තර කිරීමට
- නර්තන, ගායන, වාදන අංග පිළිබඳ ව තොරතුරු දැන ගන්නට
- පෙරහරේ සංස්කෘතිකමය අගය හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරන්නට
- පෙරහරක වැදගත්කම පිළිබඳ ව සාමූහික ව කරුණු ඉදිරිපත් කරන්නට.
- පෙරහර පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරන්නට

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## පියවර 01

ඔබ නරඹන ලද පෙරහරක් මතකයට නඟා ගනිමින් පහත චිත්‍රය හොඳින් නිරීක්ෂණය කරන්න.



## පියවර 02

ඉහත චිත්‍රය ඇසුරින් පහත සඳන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

1. මෙහි දක්නට ලැබෙන්නේ පෙරහර අවස්ථාවකි. ( )
2. මෙම අවස්ථාවෙන් සතුටක්, ලබා ගත හැකි ය. ( )
3. පෙරහර එකමුතුකම පෙන්නුම් කරන හොඳ අවස්ථාවකි. ( )
4. විවිධ සැරසිලි මෙහි දක්නට ඇත. ( )
5. නර්තන, වාදන මෙහි දක්නට නැත. ( )
6. මෙය ආගමික පෙරහරක් නොවේ. ( )
7. විවිධ අංග මනා ලෙස පෙළ ගැසුණු ආකාරයක් දක්නට ලැබේ. ( )
8. ආගමික භක්තියක් මෙයින් පිළිබිඹු වේ. ( )
9. විවිධ වයස් සීමාවල පසුවන්නන් මෙහි කාර්යයන් හි නිරත වෙයි. ( )
10. පෙරහර ආලෝකවත් කර ගැනීම සඳහා විදුලි පහන් භාවිතයට ගෙන ඇත. ( )

ඔබ දැක ඇති පෙරහර ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. ඔබ දැක ඇති පෙරහර නම් කරන්න?
2. එහි දක්නට ලැබුණු නර්තන අංග කිහිපයක් ලියන්න.
3. සැරසිලි කිහිපයක් ලියන්න.
4. ගායන, වාදන අවස්ථා ලියා දක්වන්න.
5. පෙරහරේ ඔබ වඩාත් සිත්ගත් අවස්ථාව සඳහන් කරන්න.
6. පෙරහර සඳහා ඔබ සහභාගි වී තිබේ ද? එසේ නම් එම අවස්ථා ලියා දක්වන්න.
7. පෙරහර සඳහා සහයෝගය දක්වන අය කවුරුන් ද?

- පෙරහරේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ ගුරුවරයාගේ සාකච්ඡාවකට සහභාගි වන්න.

## පියවර 03

ගුරුවරයා විසින් ලබාදෙන පෙරහැරක වීඩියෝවක් නරඹා එහි සුන්දරත්වය පිළිබඳ කථාවක් කිරීමට සූදානම් වන්න. අවශ්‍ය උපදෙස් ගුරුවරයා ලබාදෙනු ඇත.

## පියවර 04

පෙරහරක සුන්දර මතකය අවදි කර ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් එකක් තෝරාගෙන ඉදිරිපත් කරන්න.

- නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සකස් කිරීම (PRESENTATION)
- පුවත් පතකට ලිපියක් සකස් කිරීම
- උදෑසන රැස්වීමට කතාවක් ඉදිරිපත් කිරීම

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

### ස්වයං තක්සේරුව

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | ගමේ/ ප්‍රදේශයේ පවත්නා පෙරහරක් තෝරා ගෙන නම් කිරීම | | | | |
| 2 | පෙරහර පැවැත්වීමට හේතු හා එහි එන චාරිත්‍ර විස්තර කිරීම | | | | |
| 3 | නර්තන, ගායන, වාදන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | | | | |
| 4 | පෙරහරේ සංස්කෘතික අගය හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීම | | | | |
| 5 | පෙරහරක වැදගත්කම පිළිබඳ ව විස්තර කිරීම | | | | |

# නර්තනය

## පළමු වාරය

### අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුලය - II

# 6 ශ්‍රේණිය

# සම්ප්‍රදාය ඇසුරින් නිර්මාණ කරමු



## මොඩියුලය II - හැඳින්වීම

මෙම මොඩියුලය මගින් 21වන සියවසට අදාළ චින්තනමය කුසලතා, සමාජමය කුසලතා හා පෞද්ගලිකමය කුසලතා මෙන් ම ඉගෙනුම් හැකියා මෙන් ම අනාගත වෘත්තීය අවස්ථාවන්ට ද මං පාදා දෙනු ඇත. විටෙක ඔබ පන්ති කාමරයේ ද, විටෙක අවට පරිසරයේ ද, තවත් විටෙක තාක්ෂණික ක්‍රියාකාරකම්හි නියැළීමට ද මෙහි ඉගෙනුම් අවස්ථා සැලසුම් වී ඇත. ඉගෙනීම සතුටින් කිරීමටත්, ඉගෙන ගත් දේ සතුටින් භාවිත කිරීමටත් මෙම මොඩියුලය මගින් මංපාදා දෙනු ඇත. ඔබ ඉගෙන ගත් ක්‍රියාකාරකම් ඇසුරු කර ගෙන ප්‍රසංගයක් සැලසුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

| ඉගෙනුම් පල | ශ්‍රේණියේ ඉගෙනුම් අවස්ථා |
|---|---|
| සරල කැටයමක් සඳහා සුදුසු අමුද්‍රව්‍ය තෝරා ගෙන විධික්‍රම අනුගමනය කරමින් කැටයමක් සැරසිල්ලක් නිර්මාණය කරයි. | ගස්වැල්, ගංගා, දිය ඇළි, මුහුද හා බැඳි ශබ්ද, නාද, චලන, හැඩතල හා වර්ණ හඳුනා ගනිමින් එහි කලාත්මක ලක්ෂණ අගය කිරීම. |
| ශරීරයේ කොටස් හඳුනා ගෙන එම කොටස් අතර සහසම්බන්ධය පවත්වා ගනිමින් චලන ඉදිරිපත් කරයි. | විධික්‍රම අනුගමනය කරමින් ශරීරයේ ප්‍රධාන කොටස් හා අනුකොටස් නර්තනය සඳහා භාවිත කිරීම. |
| මාත්‍රා 2 තාලය හඳුනා ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදෙයි. | 2+2 තාල රූපය හඳුනා ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීම. |
| විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කර ඉදිරිපත් කරයි. | විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් වාදනයට සුදුසු උපකරණයක් නිර්මාණය කිරීම මගින් නිර්මාණ කුසලතා වර්ධනය කර ගැනීම. |
| නර්තන ප්‍රසංගයක් සඳහා සැලසුමක් ඉදිරිපත් කරයි. | සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ අවබෝධය ලබා ගනිමින් නර්තන ප්‍රසංගයක් නිර්මාණය කිරීම. |

# ක්‍රියාකාරකම 01

කාලච්ඡේද 02

# සරල කැටයම් සහිත සැරසිල්ලක් නිර්මාණය කරමු

## හැඳින්වීම

අප ජීවත් වන පරිසරය හරිම සුන්දරයි. ඒ පරිසරය මගින් ලබා ගන්නා අත්දැකීම් විවිධාකාර වේ. දැකීමෙන්, ඇසීමෙන් හා භාවිතයෙන් ලබාගන්නා වූ එකිනෙකට වෙනස් වූ අත්දැකීම් අලුත් දෙයක් නිර්මාණය කිරීමට වැදගත් වේ. එසේත් නැති නම් නිර්මාණාත්මක චින්තනය මූලික වේ. මෙසේ නිර්මාණාත්මක ව යමක් කිරීමට නම් ඔබේ සෞන්දර්යාත්මක සිතිවිලි උපකාරී වේ. ඔබට හමුවන ඕනෑම නිර්මාණයක දක්නට ලැබෙන සුන්දරත්වය නිවැරදි ව හඳුනා ගත යුතු ය. ඒ සඳහා එහි හැඩය, වර්ණය, රේඛාව මෙන් ම එහි නිමාව පිළිබඳ ඔබ වඩාත් අවධානයක් යොමු කළ යුතු ය.

අද ඔබ සූදානම් වන්නේ ඔබට පහසුවෙන් ම ළඟා කර ගත හැකි අමුද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණයක් කිරීමටයි. ගොප් කොළ, පොල් කොළ, ක්‍රෝටන් කොළ වැනි අමුද්‍රව්‍යවලින් කරන ලද නිර්මාණ ඔබ දැක ඇත. එවැනි සරල නිර්මාණයක් කිරීමටයි ඔබ සූදානම් වන්නේ. දී ඇති උපදෙස් නිසි පරිදි පිළිපදිමින් ඔබේ හසුරු කුසලතාව එළි දැක්වීමට අවස්ථාවක් මෙන් ම ඔබේ හැකියාව හඳුනා ගෙන සතුටින් එය සංවර්ධනය කර ගැනීමට ද මෙය පිටිවහලක් වනු ඇත.

**මෙම ක්‍රියාකාරකමින් ...**

- සරල කැටයමක් නිර්මාණය කිරීම සඳහා ගැළපෙන අමුද්‍රව්‍ය හා උපකරණ තෝරා ගැනීමට.
- සරල කැටයමක් සඳහා සුදුසු ආකෘතියක් නිර්මාණය කිරීමට.
- නිවැරදි ක්‍රම අනුගමනය කරමින් විවිධ අමුද්‍රව්‍ය හා උපකරණ යොදා ගෙන සරල කැටයමක් නිර්මාණය කිරීමට.
- නිර්මාණ කුසලතා වර්ධනය ජීවිතයේ විවිධ අවස්ථා සඳහා යොදා ගත හැකි අයුරු විස්තර කිරීමට.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදෙමින් සතුටක් ලබන්නට.

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## පෙර සූදානම

- ගුරුවරයා විසින් ලබාදෙන ගොප් කැටයමින් අලංකාර වූ උත්සවයක වීඩියෝ පටයක් නරඹන්න.

**ක්‍රියාකාරකම ආරම්භයට පෙර අවශ්‍ය අමුද්‍රව්‍ය සූදානම් කර තබා ගන්න.**

## යොදා ගත හැකි අමුද්‍රව්‍ය

- ගොප් කොළ, පොල් කොළ, හබරල කොළ, කෙසෙල් බඩ, පොල් ඉරටු, ක්‍රෝටන් කොළ යන ආදියත් සෘජුෆෝම්, ලී, ටින්ටස් ඇණ ආදිය

★ ජාතික අධ්‍යාපන ආයතනයෙන් සකසන ලද "ගොප් කොළ කලාව" සංයුක්ත තැටිය හෝ අන්තර්ජාලය ඇසුරෙන් මේ සම්බන්ධ නිර්මාණ නරඹන්න.

★ ඇමුණුම් අංක 01 හොඳින් අධ්‍යනය කරන්න.

### අධ්‍යයනය සඳහා උපදෙස්

- සමස්ත රූපය හඳුනා ගන්න.
- එහි ඇති වර්ණ, රේඛා හා හැඩතල හොඳින් අධ්‍යයනය කරන්න.
- ගුරු උපදෙස් පිළිපදින්න

## ඇමුණුම් අංක 01



## පියවර 01

ඔබ දුටු ඇමුණුම් අංක 01 ඡායාරූපය ඇසුරින් පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

1. ඡායාරූපයේ දක්නට ලැබෙන සත්ත්ව රූප හා වස්තූන් නම් කරන්න.
2. මෙම ඡායාරූපයේ දැක්වෙන වර්ණ මොනවා ද?
3. එම ඡායාරූපයේ දැක්වෙන නිර්මාණය සැකසීම සඳහා ස්වාභාවික පරිසරයෙන් යොදා ගෙන ඇති ද්‍රව්‍ය නම් කරන්න.
4. එම ඡායාරූපයේ දැක ගත හැකි හැඩතල විස්තර කරන්න.
5. මෙම නිර්මාණය ගැන ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

ඇමුණුම් අංක එකෙහි සඳහන් තොරතුරු ගුරුතුමාගේ උපදෙස් මත ඔබ විසින් ම තක්සේරු කර ගන්න.

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | ඡායාරූපයේ දැක්වෙන සත්ත්ව රූප නිවැරදි ව හඳුනා ගැනීම | | | | |
| 2 | ඡායාරූපයේ ඇති වර්ණ නිවැරදි ව හඳුනා ගැනීම | | | | |
| 3 | ඡායාරූපයේ දැක්වෙන නිර්මාණය සඳහා භාවිත අමු ද්‍රව්‍ය නිවැරදි ව හඳුනා ගැනීම | | | | |
| 4 | ඡායාරූපයේ දැක්වෙන නිර්මාණයෙහි ඇති හැඩතල නිවැරදි ව හඳුනා ගැනීම | | | | |

## පියවර 02

- ක්‍රියාකාරකම් අංක 01 ට අදාළ ව සිසුන් විසින් ලබා දුන් පිළිතුරු හා තක්සේරුව ආශ්‍රයෙන් ගුරුවරයා සාකච්ඡාවක් මෙහෙයවනු ඇත.
- ඡායාරූපය රස විඳීමේ දී පහත සඳහන් ඉඟි පිළිබඳව ද අවධානය යොමු කරන්න.

**ඉඟිය**

- සැරසිලි නිර්මාණය කිරීමේ දී විවිධ අමුද්‍රව්‍ය භාවිත කරනු ලබයි.
- මේවා ස්වාභාවික පරිසරයෙන් පහසුවෙන් ලබා ගත හැකි වෙයි.
- මෙම අමුද්‍රව්‍ය එක් කිරීමෙන් නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කළ හැකි වෙයි.

## පියවර 03

සූදානම් කර ගන්නා ලද අමුද්‍රව්‍ය ඇසුරෙන් පහත ක්‍රියාකාරකම සිදු කරන්න.

- ගොප් කොළ, පොල් කොළ, හබරල කොළ, කෙසෙල් බඩ, පොල් ඉරටු, ක්‍රෝටන් කොළ යන ආදියත් සෘජුෆෝම්, ලී, ටින්ටස් ඇණ... ආදිය
- ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ගුරුවරයාගේ උපදෙස් ලබා ගන්න.

### සිසු ක්‍රියාකාරකම

- පහත සඳහන් ඡායාරූප දෙක හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඡායාරූපය තුළ දක්නට ලැබෙන නිර්මාණයෙහි දැක ගත හැකි කැටයම් හොඳින් බලන්න.
- එම නිර්මාණවල රේඛා, හැඩතල හා වර්ණ යොදා ඇති ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න.
- නිරීක්ෂණය කරන ලද ඡායාරූප ඇසුරෙන් ඔබ සූදානම් කරගත් අමුද්‍රව්‍ය භාවිත කර නිර්මාණයක් කරන්න (ගුරු උපදෙස් ලබාගන්න).



1 සැරසිල්ල



2 සැරසිල්ල

**පැවරුම් අංක 01**

- ගුරු උපදෙස් මත සුදුසු පරිදි කණ්ඩායම් වන්න.
- ඔබ විසින් රැගෙන එන ලද ද්‍රව්‍ය හුවමාරු කර ගන්න.
- ඉහතින් අධ්‍යයනය කළ ඡායාරූප දෙක අතරින් ඔබ කැමති ඡායාරූපය තෝරා ගන්න.

## පියවර 04

- එක් එක් කණ්ඩායම තම නිර්මාණයට අදාළ කාර්යයන් හඳුනා ගන්න.
- ක්‍රියාකාරකම සඳහා දී ඇති උපදෙස් හොඳින් අධ්‍යයනය කරන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- නිරීක්ෂණය කරන ලද ඡායාරූපය ඇසුරෙන් නිර්මාණයක් සිදු කරන්න.
- සරල ආකෘතියක් සකස්කර ගන්න. ගුරු උපදෙස් ලබාගන්න.
- මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී උපකරණ ප්‍රවේශමෙන් පරිහරණය කරන්න.

## අවශ්‍ය උපදෙස්

- නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යවල දිග පළල නිවැරදි ව සැලසුම් කර ගන්න. (තෝරා ගන්නා ආකෘතියට අනුව දිග පළල පහත අයුරින් යොදා ගන්න)
- ගොප් කොළයේ දිග - අඟල් හයක් පමණ ප්‍රමාණවත් වේ.
- පොල් කොළයේ දිග - අඟල් හතරක් පමණ ප්‍රමාණවත් වේ.
- මෙය නිර්මාණය කිරීමේ දී ඔබ විසින් නරඹන ලද "ගොප් කොළ කලාව" දෘශ්‍ය පටය හෝ විවිධ උත්සව අවස්ථාවල ගොප් සැරසිලි තුළ දුටු ක්‍රමශිල්ප උපයෝගී කර ගන්න.
- නිර්මාණය කිරීමේ දී වර්ණ සංයෝගය ඇති වන පරිදි අමුද්‍රව්‍ය යොදා ගන්න.
- ඔබ විසින් නිර්මාණය සකස් කිරීම සඳහා යොදා ගත් ආකෘතිය ඇසුරු කර ගෙන ඔබගේ හැකියාව අනුව නිර්මාණය කරන්න.
- ඔබ කණ්ඩායම විසින් සකසන ලද නිර්මාණය ගුරුවරයාගේ ඇගයීමට ලක් වේ.
- ඔබ කණ්ඩායම විසින් සකසන ලද නිර්මාණය පිළිබඳ ව පහත සඳහන් නිර්ණායකවලට අනුව ස්වයං තක්සේරුකරණයේ යෙදෙන්න.

## පියවර 05

- ස්වයං තක්සේරුවක නිරතවන්න. අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න

| | මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | සරල නිර්මාණය සඳහා ගැළපෙන අමුද්‍රව්‍ය තෝරා ගෙන ඉදිරිපත් කිරීම | | | | |
| 2 | සරල නිර්මාණයක ආකෘතියක් සකස් කිරීම | | | | |
| 3 | නිවැරදි ක්‍රම භාවිත කරමින් සරල නිර්මාණයක් කිරීම | | | | |
| 4 | නිර්මාණ යොදා ගත හැකි විවිධ අවස්ථා පෙළගැස්වීම | | | | |
| 5 | එම නිර්මාණය වැදගත් වන අයුරු ප්‍රකාශ කිරීම | | | | |

## ඉදිරි පෝෂණය හා ප්‍රතිපෝෂණය

මෙම පාඩම අවසානයේ සිසුන් ලබා ගත් දැනුම භාවිතයට ගැනීමේ අවස්ථා ලෙස පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.

1. ගොප් කොළ කැටයම් සිදු කරන ශිල්පීන් හඳුනා ගෙන එම ශිල්පීන් විසින් සිදු කරනු ලබන කැටයම් පිළිබඳ තොරතුරු ගොනු කරන්න. එම කැටයම් අතරින් ඔබ කැමති කැටයමක් නිර්මාණය කරන්න.
2. පාසලේ පැවැත්වෙන වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය සඳහා පරිසරයෙන් සොයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිත කර සැරසිලි නිර්මාණය කරන්න.
3. පොල් කොළ හා ගොප් කොළ වැනි පාරිසරික අමුද්‍රව්‍ය ඇසුරු කර සකස් කර ඇති නිර්මාණ පිළිබඳ තොරතුරු පහත ආකෘතියට අනුව ගොනු ගත කරන්න.

| අනු අංකය | නිර්මාණය දුටු ස්ථානය | භාවිත කළ අවස්ථාව | යොදා ගෙන තිබූ අමුද්‍රව්‍ය |
|---|---|---|---|
| 01 | උදා - පාසලේ විවිධ ප්‍රසංගය | පොල්තෙල් පහන් දැල්වීම | ගොප් කොළ, පොල් කොළ, කෙසෙල් බඩ |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |

# ශරීරයේ කොටස් හඳුනා ගැනීම හා චලන භාවිතය




යහළුවන් සමග සෙල්ලම් කිරීමට ඔබ ඉතා ප්‍රිය කරයි. ඔබ සෙල්ලම් කරන විට ශරීරාංග විවිධාකාරයෙන් හසුරුවන්නේ නිරායාසයෙනි. එසේ ම නර්තනයක දී ද සිදු වන්නේ විවිධ ආකාරයෙන් අපේ ශරීරාංග හැසිරවීමයි.

එහෙත් ඒ සඳහා පිළිගත් විධික්‍රම භාවිත කිරීම හා යම් තාලයකට සිදු කිරීම එහි ඇති විශේෂත්වය යි. නර්තනයේ දී අත්, පා, හිස, ඇස් යනාදි වශයෙන් වූ ශරීරාංග කිහිපයක් එකිනෙක හා සම්බන්ධතා ගොඩනගා ගැනීම දැකිය හැකි ය.

එනිසා ඔබගේ ශරීරාංග විවිධ විධික්‍රම අනුව හැසිරවීම පිළිබඳ දැනුමක්, අවබෝධයක් ලබා තිබීම නර්තන විෂය හදාරන ඔබට ඉතා ප්‍රයෝජනවත් වේ. දෑත්, දෙපා, හිස විවිධ දිශාවන්ට ගමන් කරවීම, ඒ සඳහා විවිධ වේගයන් භාවිත කිරීම, ඒවා හසුරුවන ස්වභාවය වැනි කරුණු මෙම මොඩියුලය මගින් ඔබට ඉගෙන ගැනීමට අවස්ථාව ලැබෙයි.

හිස, කඳ, අත්, පා, ආදි වූ සිරුරේ ප්‍රධාන කොටස් ද ඒවා එකිනෙක හා සම්බන්ධ කරන උරහිස, බෙල්ල, දණහිස, වැලමිට ආදී කොටස් ද යම් අදහසක් ඉදිරිපත් කිරීමට භාවිත කරන මුහුණේ ඇස්, ඇහිබැම, කම්මුල්, තොල් ආදී වූ සියුම් අංග ද වශයෙන් ශරීරාංග තුන් ආකාරයකින් දැක්විය හැකි ය. මෙම ශරීරාංග භාවිත කරමින් නර්තනයේ දී සිදු කරන විවිධ ක්‍රියාකාරකම්, නර්තනයේ අලංකාරයට මෙන් ම ඔබගේ සිරුර සිත් ඇදගන්නා සුළු බවින් නම්‍යශීලී ව පවත්වා ගැනීමට ද ඔබට වැදගත් වෙයි. එමෙන් ම දෛනික ජීවිතයේ දී ඔබගේ බොහෝ ක්‍රියාකාරකම් පහසුවෙන්, කාර්යක්ෂම ව, ප්‍රබෝධයෙන් යුතු ව ඉටු කර ගැනීමට ද එය ප්‍රයෝජනවත් වනු ඇත.

## මෙම ක්‍රියාකාරකමින් ...

- නර්තනය සඳහා භාවිතයට ගත හැකි සිරුරේ කොටස් නම් කරන්නට.
- විවිධ ක්‍රම අනුගමනය කරමින් නර්තනය සඳහා සිරුරේ කොටස් භාවිත කිරීමට
- ශරීරයේ විවිධ අංග සම්බන්ධතාවන් පවත්වා ගනිමින් විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙන්නට
- තාලයට අනුව ශරීරාංග හසුරවමින් චලන ඉදිරිපත් කර සතුටක් ලබන්නට
- රිද්මයකට අනුව ශරීරාංග චලනය කරන්නට
- තම සිරුර නිරෝගී ව සහ නම්‍යශීලී ව පවත්වා ගැනීමට චලන වැදගත් වන බව ප්‍රකාශ කරන්නට

ඔබට හැකියාව ලැබෙනු ඇත .

## පියවර 01

නර්තනයේ දී ශරීරාංග භාවිත කරන විධි ක්‍රම හඳුනා ගැනීමට ප්‍රථම පහත රූප පෙළ නිරීක්ෂණයට යොමු වෙමු.

### ශරීරාංග හසුරවන අයුරු නිරීක්ෂණය කරමු.



ළමයි විනෝදයෙන් අත් පා හසුරවන ආකාරය බලන්න.
අපිත් මෙහෙම ශරීරාංග හැසිරවීමට ඉගෙන ගනිමු.

නර්තනයක දී ශරීරාංග භාවිත කරන ආකාරය හා විධික්‍රම මොනවා දැයි දැන ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකමට යොමු වෙමු.

අංග, ප්‍රත්‍යංග හා උපාංග භාවිත කරන අයුරු පිළිබඳ ගුරුවරයා සාකච්ඡාවක් මෙහෙයවනු ඇත.

- ගුරුවරයා ඔබට අන්තර්ජාලය ඔස්සේ දේශීය නර්තනාංගය ඇතුළත් වීඩියෝ පටයක් නැරඹීමට සලස්වනු ඇත.
- එම නර්තන අංගයේ දී දෑත්, දෙපා, හිස ආදිය චලනය කරන ආකාරය පිළිබඳ ව ඔබගේ අවධානය හොඳින් යොමු කරන්න.

■ **නැරඹූ නර්තනාංගය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඔබගේ පිළිතුර 'ඔව්' නම් පහත දැක්වෙන ☺ රූපයට පහළින් ඇති වරහන තුළ ✔ ලකුණ ද පිළිතුර 'නැත' නම් ☹ රූපයට පහළින් ඇති වරහන තුළ X ලකුණ ද යොදන්න.

| | ☺ | ☹ |
|---|---|---|
| 1. ඔබ දුටු නර්තනාංගයේ දෑත් ඉහළට ඔසවන අවස්ථා ඇත. | ( ) | ( ) |
| 2. දෑත වමට සහ දකුණට දිගු කරමින් නර්තනය කළ අවස්ථා දක්නට තිබුණි. | ( ) | ( ) |
| 3. නර්තනයේ දී දෑත දිගු කරන පැත්තට හිස හැරවූ අවස්ථා තිබුණි. | ( ) | ( ) |
| 4. අත සහ පාද කරකවමින් නර්තනයේ යෙදෙන අවස්ථා තිබුණි. | ( ) | ( ) |
| 5. බඳ කරකවමින් නර්තනය කළ අවස්ථා තිබුණි. | ( ) | ( ) |
| 6. දෑත් දෙපා විවිධ වේගයන්ට අනුව චලනය විය. | ( ) | ( ) |
| 7. අත්ල ඇතුළට සහ පිටතට හරවමින් නර්තනයේ යෙදුණි. | ( ) | ( ) |
| 8. විවිධ නර්තන අවස්ථාවල දී සිරුර විවිධ පැතිවලට නැවීම සිදු නොවුණි. | ( ) | ( ) |

ඔබගේ මිතුරන් සමග එක් ව පිළිතුරු නිවැරදි දැයි පරීක්ෂා කරන්න.

**රූපයේ ලකුණු කර ඇති ශරීරාංග හැසිරවිය හැකි ක්‍රම, හිස්තැන් තුළ ලියන්න.**




1 ...............................
2 ...............................
3 ...............................
4 ...............................
5 ...............................

## පියවර 02

ශරීරාංග භාවිත කරමින් පරිසර අත්දැකීම් නිරූපණය කරමු.



i. ඉහත දැක්වෙන ගසෙහි කොටස්වලට ලකුණු කර ඇති අංක සඳහා භාවිත කළ හැකි ශරීරාංග සටහන් කරන්න.

ii. ඔබේ ශරීරාංග යොදා ගනිමින් පරිසරයේ දුටු ගසක ස්වභාවය නිරූපණය කර පෙන්වන්න.

iii. සිසුන් කණ්ඩායම් වශයෙන් එක්ව ශරීරාංග භාවිත කරමින් ගසක් නිර්මාණය කරන්න.

iv. පහත සඳහන් විවිධ අවස්ථාවල දී ගසක ස්වභාවය ශරීරාංග භාවිත කරමින් තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරන්න.

1. ගසක අතු මඳ සුළඟට සෙලවීම
2. තද සුළඟක දී ගසක අතු සෙලවීම
3. ගසක මල් පිපීම, සෙලවීම

v ඉහත අවස්ථාවන් ශරීරාංග භාවිත කරමින් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරන්න.





හිස්තැන්වලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළ ඇති වචනවලින් තෝරා ලියන්න. (නම්‍යශීලී ව, වේගයෙන්, ශරීර, සතුටක්, දෑත)

1. ................ අංග භාවිත කරමින් පරිසරයේ ජීව අජීව වස්තූන් නිරූපණය කළ හැකි ය.
2. විවිධ ක්‍රියාකාරකම්වල දී සිරුර .................... පවත්වා ගැනීම වැදගත් වේ.
3. තද සුළඟක් නිරූපණය කිරීමේ දී ශරීරාංග ................................ චලනය වේ.
4. කුරුල්ලකුගේ පියාපත් නිරූපණය කර පෙන්වීමට ..................... භාවිත කළ හැකි ය.
5. ශරීරාංග තාලානුකූල ව හැසිරවීමෙන් ....................................... ලැබිය හැකි ය.

### අවශ්‍ය උපදෙස්

- පහත සඳහන් ක්‍රියාකාරකම් සංගීත බණ්ඩ හෝ බෙර වාදනයට අනුව කිහිප වාරයක් කරන්න.
- ක්‍රියාකාරකම් කිරීමේ දී ගුරුවරයාගේ මඟපෙන්වීම ලබා ගන්න.
- තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකම් සිදු කරන්න.
- ක්‍රියාකාරකම්වල දී උපයෝගි කර ගන්නා ශරීරාංග පිළිබඳ ව ඔබගේ අවධානය හොඳින් යොමු කර අදාළ පිළිතුරු ලියන්න.

**පහත ක්‍රියාකාරකම්වල නිරත වන්න.**

1. ඉදිරිය බලා තාලයට ඇවිදීම
2. අත්ල ඇතුළට පිටට හරවමින් රවුමට ගමන් කිරීම
3. දෑත් ඉණෙහි තබා එකතැන සිට ඉණ කැරකවීම
4. දෑත් ඉණේ තබා උරහිස් කැරකැවීම.
5. කකුලේ ඇඟිලිවලින් පනිමින් (Skip කරමින්) ඉදිරියට පිටුපසට යාම.

- මේ සදහා ඔබට කැමති වෙනත් ක්‍රියාකාරකම් අභ්‍යාස ද මේ සඳහා යොදා ගත හැකි ය.

### කාර්ය පත්‍රිකා 01

| අභ්‍යාස | භාවිත කළ ශරීරාංග | ශරීරාංග භාවිත කළ ආකාරය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

## පියවර 03

නර්තනයේ දී ශරීරාංග හසුරුවන ආකාරය පිළිබඳ යම් දැනුමක් මේ වන විට ඔබට ලැබී ඇත. පහත සඳහන් ක්‍රියාකාරකම් මගින් එය ඔබට තවදුරටත් ප්‍රායෝගික ව අත්විඳීමට හැකියාව ලැබෙයි.





**ක්‍රියාකාරකමට අදාළ උපදෙස්**

- ලබා දී ඇති නර්තන විලාස දැක්වෙන ඡායාරූප දෙස හොඳින් බලන්න.
- ඡායාරූපවලින් දැක්වෙන නර්තන ශිල්පීන්ගේ ශරීරාංග පිහිටුවා ඇති ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න.
- නර්තන අවස්ථාවල දී අත, හිස, ඇස එකිනෙක සම්බන්ධ වන්නේදැයි නිරීක්ෂණය කරන්න
- ගුරුවරයාගේ මෙහෙයවීමෙන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදෙන්න.

A



B



C



- ABC ඡායාරූප අතරින් ඔබ වඩාත් සිත් ගත් ඡායාරූපයක් තෝරා ගන්න. එය නැවත හොඳින් බලන්න.
- ඔබගේ ශරීරාංග භාවිත කර ඡායාරූපවල දක්නට ඇති නර්තන ඉරියව් ඉදිරිපත් කරන්න.
- ඔබගේ ශරීරාංග හසුරුවා ඇති ආකාරයත් ඡායාරූපයත් අතර ඇති සමානතා අසමානතා ඉදිරිපත් කිරීමට වෙනත් කණ්ඩායමකට අවස්ථාවක් ලබා දෙන්න.
- ඔබගේ ක්‍රියාකාරකම අතරතුර ඡායාරූපයක් ලබා ගැනීමට සලස්වා එහි ඉරියව් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

## පියවර 04

- ඔබ මෙතෙක් ශරීරාංග හසුරුවමින් ඉදිරිපත් කරන ලද විවිධ චලන උපයෝගී කර ගෙන කැමති ගීතයකට හෝ සංගීත ඛණ්ඩයකට නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

## පියවර 05

- පහත සඳහන් වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

**ස්වයං තක්සේරුව**

| | මට දැන් කළ හැකි ය. | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | නර්තනය සඳහා භාවිතයට ගත හැකි සිරුරේ කොටස් නම් කිරීම. | | | | |
| 2 | නර්තනය සඳහා සිරුරේ කොටස් විවිධාකාරයෙන් භාවිත කිරීම. | | | | |
| 3 | ශරීරාංග සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් නර්තනයට අදාළ ක්‍රියාකාරකම්වල යෙදීම. | | | | |
| 4 | සංගීත ඛණ්ඩයට අනුව ශරීරාංග හසුරුවමින් චලන ඉදිරිපත් කිරීම. | | | | |
| 5 | සිරුර නිරෝගී ව හා නම්‍යශීලී ව පවත්වා ගැනීමට චලන වැදගත් වන බව ප්‍රකාශ කිරීම. | | | | |

ප්‍රතිපෝෂණ (පහත සඳහන් සිද්ධිය උචිත චලන භාවිත කරමින් ඉදිරිපත් කරන්න)

01. අලංකාර දිය ඇල්ලක් නැරඹීමට ඔබට අවස්ථාවක් ලැබෙයි. දිය ඇල්ල අසලට ළඟා වීමට නම් ටික දුරක් කැලයක් මැදින් ගමන් කිරීමට සිදුවෙයි. ගස් ගල් වැනි දෑ අතරින් ගමන් ගන්නා ඔබට පහත දැක්වෙන දේවල් ද පසු කිරීමට සිදු වෙයි.
    - වතුර රැඳුණු ස්ථානයක්
    - වැටක්
    - බිමට නැමී ඇති අත්තක්

02. ඔබ කැමති ක්‍රීඩාවක අවස්ථා කිහිපයක් උචිත චලන භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

# තාලාවබෝධය (මාත්‍රා 2 තාලය)

## හැඳින්වීම

නර්තනය හා වාදනය එක ම කාසියක දෙපැත්ත මෙනි. නර්තනයේ චමත්කාරයත් උද්යෝගයත් වැඩි කෙරෙන්නේ වාදනයෙන් බව ඔබ අවබෝධ කර ගත යුතු ය. ඒ අනුව නර්තනයක් වාදනයක් එක මාර්ගයක ගමන් කිරීම සඳහා තාලයක් අවශ්‍ය බව ඔබට වැටහෙනු ඇත. නර්තනය, ගායනය හෝ වාදනයේ ස්වභාවය අනුව තාලය වෙනස් වේ. එම තාලය මැනවින් පවත්වා ගැනීම සඳහා ආධාරකයක් වශයෙන් ද වාදනයට අලංකාර ගෙන දීම සඳහා ද තාලම්පට භාවිත වේ. විවිධ කවි ගායනා මෙන් ම බෙරපද කොටස් ඇසෙන විට ඔබ දැනුවත් ව හෝ නොදැනුවත් ව චලන කිරීමට පෙළඹෙයි. ඒවා සංකීර්ණ මෙන් ම සරල වන්නට ඇත. ඒ අනුව ගායනය, වාදනය, නර්තනය යන ත්‍රිවිධ ක්‍රියාවලිය තාලයක් මත ගොඩනැගී ඇති බව ඔබට වැටහෙනු ඇත. දැන් ඔබට එම ක්‍රියාකාරකමේ යෙදෙන්නට අවස්ථාවක් උදා වී ඇත. මෙම පාඩම සඳහා දෙන ලද විවිධ ක්‍රම මගින් සතුටින් ඉගෙනීමට ඔබට හැකි වනු ඇත.

### මෙම ක්‍රියාකාරකමින් ...

- මාත්‍රා 2 තාලය හඳුනා ගෙන නම් කිරීමට
- මාත්‍රා 2 තාලය හා බැඳි තාල රූපය විස්තර කරන්නට
- තනි තිතේ තාලය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට
- මාත්‍රා 2 තාලය ට ක්‍රියාකාරකම්වල යෙදෙමින් සතුටු වන්නට
- විවිධ අභ්‍යාස  කරමින් තාලය පිළිබඳ ඉගෙන ගැනීමට
- කණ්ඩායම් ක්‍රියාකාරකම් හි යෙදෙමින් සතුටක් ලබන්නට

ඔබට හැකියාව ලැබෙනු ඇත .

## පියවර 01

- මෙම ක්‍රියාකාරකමට පෙර සූදානමක් වශයෙන් තනිතිතේ තාලරූප පිළිබඳව ගුරුවරයා සාකච්ඡාවක් මෙහෙය වණු ඇත.

### ඇමුණුම් අංක 01

ඔබ ඉගෙන ගන්නා සම්ප්‍රදායට අදාළ බෙරය තෝරා ගන්න.

  

### ඇමුණුම් අංක 02 - සිසු ක්‍රියාකාරකම් 01

ඔබ ඉගෙන ගන්නා සම්ප්‍රදායට අදාළ බෙරය වාදනය කරමින් ගුරුතුමා විසින් ඉදිරිපත් කරන කවි ගායනය ශ්‍රවණය කරන්න.



කුඳ ගත ගත දොම්



පළමුව මුනි සරණේ - වදිම් මම
දෙවනු දහම් සරණේ
තෙවනුව සඟ සරණේ-මුදුනත
දැරුවෙමි තුන් සරණේ



රුදි කිට තත් දොම්



| | |
|---|---|
| සොබන එනා රද සිරිනි වි | රාගය |
| සමන වෙමින් වීණා දඬු | රාගය |
| කියන මියුරු කළ සුලලිත | රාගය |
| අසන මතින් ඇගෙ සිතුවිලි | රාගය |



ජිමිත කුදා දොම්



| | |
|---|---|
| සත් පත්තිනි වැඩ | මෙරඟට |
| එරන් සලඹ ගෙන | සුරතට |
| ඒ සලඹේ නාද | හඬට |
| වදුරු දෝස යයි | දුරු කොට |

නැවතත් ගුරුවරයා ඉහත ක්‍රියාකාරකමේ යෙදෙන අතරතුර ඔබ තාල තැබීමේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

## පියවර 02

ගුරුවරයාගේ ගායනය හා වාදනය ශ්‍රවණය තුළින් ලබා ගත් අත්දැකීම් සටහන් කරන්න. පහත සඳහන් වාක්‍ය හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද දී ඇති වරහන තුළ දක්වන්න.)

- අදාළ බෙර පද/ දවුල් පදවලට ගායනය කරයි. (...........)
- බෙරපද/ දවුල් පද වාදනයේ දී තාලයකට අනුව සිදු කරයි. (...........)
- ගායනයේ දී තාලයක් දක්නට ලැබෙයි. (...........)
- තාල තැබීමේ දී ඒකාකාරී බවක් දක්නට ලැබෙයි. (...........)
- ගායනයට හා වාදනයට අනුව තාලයක් නිර්මාණය වෙයි. (...........)

## පියවර 03

පන්තියේ සියලු ම සිසුන් කණ්ඩායම් තුනකට වෙන් වී A,B,C වශයෙන් නම් කරන්න. පහත සඳහන් පරිදි එම කණ්ඩායම්වලට අදාළ අභ්‍යාසවල යෙදෙන්න.

පහතින් දී ඇති උපදෙස් පිළිපදිමින් බෙර / දවුල් පදයට හා කවියට තාල තැබීමේ දී මාත්‍රා 2+2 තාලයට අනුව තාලම්පට වාදනය වූ ආකාරය අවබෝධ කර ගන්න. එම තාල රූපය ''සුළු තනි තිත'' වශයෙන් ද ඔබට හඳුනා ගැනීමට හැකි වනු ඇත. එය තනි තිතක් බැවින් තාලම්පට එකිනෙකට ලිස්සා වාදනය කළ යුතු වේ.



- රැදි කිට තත් දොම්
- කුඳ ගත ගත දොම්
- පිම්ත කුදා දොම්

- සොබන එනා රද ....
- පළමුව මුනි සරණේ
- සත්පත්තිනි වැඩ ......

A කණ්ඩායම → තාල තබයි

B කණ්ඩායම → බෙර පද කියයි

C කණ්ඩායම → කවි ගායනය කරයි

- අදාළ කණ්ඩායම් හුවමාරු කර ගනිමින් ඉහත අභ්‍යාසයේ නැවත නැවතත් යෙදෙන්න. අභ්‍යාස අතරතුර ගුරුවරයා සමග සාකච්ඡා කරමින් පාඩම අවබෝධ කරගන්න. ඒ අතරතුර ඒ ඒ කණ්ඩායම් ලබන අත්දැකීම් ඉදිරිපත් කරන්න.

## පියවර 04

දැන් ඔබ මාත්‍රා 2+2 තනි තිතේ තාලය පිළිබඳ අවබෝධයෙන් පහත සඳහන් අභ්‍යාසයේ යෙදෙන්න.

1. මාත්‍රා 2+2 තාලයට අයත් බෙර පදයක්/ දවුල් පදයක් තාල තබා කියන්න.
2. මාත්‍රා 2+2 තාලයට අයත් කවියක් තාල තබමින් ගායන කරන්න.
3. ඔබ කැමති මාත්‍රා 2+2 තාලයට අයත් පද කොටසකට හා කවි පදයකට අනුව චලන කරමින් තාල ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
4. ඔබ කැමති වෙනත් ඕනෑ ම නිර්මාණශීලී ක්‍රමවේදයක් මගින් මාත්‍රා 2+2 තාලය තාල තැබීමේ ක්‍රියාවලියට උත්සාහ ගන්න.

## පියවර 05

පහත සඳහන් වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

### ස්වයං තක්සේරුව

| | මට දැන් කළ හැකි ය. | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | තනිතිතේ තාල හඳුනා ගෙන නම් කිරීම | | | | |
| 2 | මාත්‍රා 2 තාලය හා බැඳි තාල රූපය ලියා දැක්වීම | | | | |
| 3 | මාත්‍රා 2 තාලයට අදාළ ගායනා කරමින් තාල තැබීම | | | | |
| 4 | මාත්‍රා 2 තාලයට අදාළ බෙරපද කියමින් තාල තැබීම | | | | |
| 5 | මාත්‍රා 2 තාලය පිළිබඳ අවබෝධයෙන් චලන ඉදිරිපත් කිරීම | | | | |

# ක්‍රියාකාරකම 04

කාලච්ඡේද 02

# විකල්ප වාද්‍ය උපකරණ සකසමු

## හැඳින්වීම

නර්තනයට මෙන් ම සංගීතය සඳහා ද වාදනය සම්බන්ධ වන අතර විවිධ භාණ්ඩ ඒ සඳහා භාවිත කරනු ලබයි. මෙම භාණ්ඩ ක්‍රමවත් ලෙස නිර්මාණය වී ඇත. එම භාණ්ඩ සකස් කිරීම සඳහා විවිධ අමුද්‍රව්‍ය භාවිත කරනු ලැබේ.ඒවාට නියමිත ප්‍රමිතියක්ද ඇත . ඔබටත් මෙවැනි වාදන උපකරණයක් නිර්මාණය කළ හැකි ය.

පරිසරයෙන් ගතහැකි ද්‍රව්‍ය භාවිත කරමින් වාදන උපකරණයක් නිර්මාණය කිරීමට ඔබට දැන් අවස්ථාවක් ලැබී ඇත. මේ සඳහා ඔබ නිවසෙහි ඉවතලන ද්‍රව්‍ය වන ටින්, ප්ලාස්ටික් බඳුන්, බෝතල් සහ විවිධ ද්‍රව්‍ය භාවිතයට ගත හැකි ය. මෙම ද්‍රව්‍යවලින් සකස් කර ගන්නා උපකරණ විකල්ප වාදන උපකරණ ලෙස හඳුන්වයි. එම උපකරණ, පිඹීම, තැලීම, ඇතිල්ලීම ආදි ක්‍රම මගින් විවිධ ශබ්ද, නාද නිපදවිය හැකි අතර ඒ සඳහා තාක්ෂණික ශිල්ප ක්‍රම ද භාවිතයට ගත හැකි ය. ඒ ආකාරයට නිමාවක් සහිත අලංකාර වාද්‍ය උපකරණයක් සකසා ගැනීමට ඔබට හැකි වෙයි.

මෙවැනි විකල්ප වාදන උපකරණ නිර්මාණය කිරීමේ අත්දැකීම් ඔබට ඇත් නම් උසස් ගණයේ වාදන භාණ්ඩ නිර්මාණය කිරීමට හැකි වනු ඇත. මේ සඳහා අන්තර්ජාල තොරතුරු හා පුවත්පත් මගින් මෙන් ම ගුරුවරුන් ඇතුළු වැඩිහිටියන්ගේ ද දායකත්වය ඇති ව ඒවා සකසා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

### මෙම ක්‍රියාකාරකමින් ...

- වාදන උපකරණයක් නිර්මාණය කිරීම සඳහා ද්‍රව්‍ය තෝරා ගැනීමට
- සතුටින් භාණ්ඩ සැකසීමේ ක්‍රියාකාරකමක යෙදෙන්නට
- විකල්ප වාදන උපකරණ පිළිබඳ තොරතුරු රැස් කරන්නට
- විකල්ප වාදන උපකරණ නිර්මාණය කිරීමේ දි සරල ක්‍රමශිල්ප භාවිතයට ගන්නට
- සාමූහික ව සහයෝගයෙන් කටයුතු කරන්නට
- නවතම වාද්‍ය උපකරණයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්නට

ඔබට හැකියාව ලැබෙනු ඇත .

## පෙර සූදානම

- මෙම ක්‍රියාකාරකම කිරීමට පෙර දිනයක පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍ය ප්‍රමාණයට රැගෙන එන්න. ඊට අමතර ව විකල්ප වාදන උපකරණ පිළිබඳ තොරතුරු රැස් කර රැගෙන එන්න.

### අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

- කතුරක්
- කුඩා හිස් ගම් බෝතල් කිහිපයක්
- වර්ණ ඩිමයි කඩදාසි, වැලිකඩදාසි
- බැලුම්බෝල කීපයක්
- හිස් ප්ලාස්ටික් තීන්ත බාල්දි/ කෑන්, ටින්, ටොනික් පියන්, කුඩා කම්බියක්, ලී දඬු කැබලි දෙක බැගින්, කෝටු දෙක බැගින්, හිස් ගම් බෝතල්, වීදුරු කීපයක් හා බෝතල් දෙක බැගින්, අඟල් 5 x 3 ලී පතුරු 2ක්
- මීට අමතර ව සිසුන් යෝජනා කරනු ලබන ද්‍රව්‍ය හා ගුරුවරයාගේ අභිමතය පරිදි අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය

## පියවර 01

- විවිධ ශබ්ද, නාද නිපදවීමේ ද්‍රව්‍ය මොනවා දැයි ගවේෂණය කිරීමට යොමු වන්න. ඒ සඳහා අන්තර්ජාල තොරතුරු නිරීක්ෂණයට හෝ පින්තූර මගින් වාදන උපකරණ හඳුනා ගන්න
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු අභ්‍යාස පොතේ සටහන් කර වාද්‍ය භාණ්ඩ / උපකරණ පිළිබඳ දැනුම තහවුරු කර ගන්න.

### කාර්ය පත්‍රිකාව 1

| අයිතමය | උත්තරය |
|---|---|
| විකල්ප වාද්‍ය උපකරණ සකස් කර ගැනීමට හැකි ද්‍රව්‍ය/ උපකරණ 5ක් නම් කරන්න. | 1 ..............................<br>2 ..............................<br>3 ..............................<br>4 ..............................<br>5 .............................. |
| පහත සඳහන් රූප ඇසුරෙන් විකල්ප වාද්‍ය උපකරණ 3ක් තෝරා ලියන්න.<br>    | 1 ..............................<br>2 ..............................<br>3 .............................. |

| | |
|---|---|
| සාම්ප්‍රදායික භාණ්ඩ 2ක් සඳහන් කරන්න.     | 1 .................................<br>2 ................................. |
| සාම්ප්‍රදායික භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණවල වෙනස ලියන්න. | 1 .................................<br>2 ................................. |
| තැලීමෙන් ශබ්දය නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ 3ක් ලියන්න. | 1 .................................<br>2 ................................. |
| සෙලවීමෙන් ශබ්දය නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ 3ක් ලියන්න. | 1 .................................<br>2 .................................<br>3 ................................. |
| පිඹීමෙන් ශබ්දය නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණයක් ලියන්න. | 1 ................................. |
| ඔබ කැමති විකල්ප වාද්‍ය උපකරණයක් සකසා ගන්නා ආකාරය විස්තර කරන්න. | |
| ඉහත විස්තර කරන ලද භාණ්ඩයට නමක් යොදන්න. | |

## පියවර 02

වාද්‍ය උපකරණයක් නිර්මාණය කිරීම පිළිබඳ ගුරු උපදෙස් ලබාගෙන ක්‍රියාකාරකමේ යෙදෙන්න.

## පියවර 03

ඇමුණුම් අංක 1 අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න. මෙහි දී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන්න.

i. තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් වාද්‍ය භාණ්ඩ සකස් කිරීමට යොමු වන්න.
ii. ඔබ විසින් තෝරාගත් ද්‍රව්‍ය හා උපකරණ අතරින් ශබ්ද හෝ නාද නිපදවිය හැකි දෑ වෙන්කර ගන්න.
iii. එම වෙන්කරගත් ද්‍රව්‍ය හා උපකරණ මගින් ශබ්ද හෝ නාද නිපදවිය හැකි ක්‍රම අත්හාදා බලන්න. උදාහරණ පිඹීම, තැලීම, ඇතිල්ලීම
iv. ඒ සඳහා ගුරුවරයාගේ උපදෙස් ලබාගෙන උපකරණය සකස් කරන්න.

1 පහත සඳහන් ඇමුණුම 1 සටහනේ දී ඇති උදාහරණය හොඳින් කියවන්න.

2 එම උදාහරණයට අනුව ඔබ නිර්මාණය කරන වාදන උපකරණය පිළිබඳ තොරතුරු ඇසුරෙන් පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

## ඇමුණුම 1

| වාද්‍ය උපකරණය | ශබ්ද, නාද නිපදවන ආකාරය | සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය |
|---|---|---|
| උදා:  එක්ස්රේ බෙරය | තැලීම | සිලින්ඩරාකාර ටින් එකක් එක්ස් රේ කොළයක් හා කෝටු 2ක් නූලක් හෝ ලණුවක් අලංකාර කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය |
| | | |
| | | |

ඇමුණුම 01 හි සැලසුම් කරගත් ආකාරයට වාද්‍ය උපකරණය නිමාවක් සහිතව සකස් කරන්න. ඒ සඳහා ගුරුවරයාගේ උපදෙස් ලබා ගන්න.

## පියවර 04

සකස් කරන ලද වාදන උපකරණ කණ්ඩායම් වශයෙන් ප්‍රදර්ශනය කරන්න. අනෙකුත් කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට අදහස් දක්වන්න.ගුරුභවතා සමග සාකච්ඡාවක නිරත වී නිමාවක් සහිත ව වාදන උපකරණය සැකසීම පිළිබඳ අදහස් ලබා ගන්න.

### ඉදිරි පෝෂණය

කණ්ඩායම් අදහස්වලට අනුව වාදනයට සුදුසු පරිදි සියලු වාදන උපකරණ සංවර්ධනය කර ගැනීමට උපදෙස් ලබා ගෙන තවත් නවතම භාණ්ඩ නිර්මාණයට පෙළඹෙන්න. එම භාණ්ඩ වාදන නිර්මාණ පාඩමේ දී භාවිතයට ගත හැකි ය.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න..

### ස්වයං තක්සේරුව

| | මට දැන් කළ හැකි ය. | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | විකල්ප වාදන උපකරණ පිළිබඳ තොරතුරු රැස් කිරීම | | | | |
| 2 | විවිධ ශබ්ද නාද නිපදවීමේ අමුද්‍රව්‍ය තෝරා ගැනීම | | | | |
| 3 | සතුටින් වාදන උපකරණයක් නිර්මාණය කිරීම | | | | |
| 4 | විකල්ප වාදන උපකරණ නිර්මාණය කිරීමේ දී විවිධ ක්‍රම භාවිතයට ගැනීම | | | | |
| 5 | සාමූහික ව සහයෝගයෙන් කටයුතු කිරීම | | | | |
| 6 | නවතම විකල්ප වාද්‍ය උපකරණයක් නිර්මාණය කිරීම හා එය නම් කිරීම | | | | |

ක්‍රියාකාරකම 05

කාලච්ඡේද 02

# ඉගෙන ගන්නා ලද ක්‍රියාකාරකම් ඇසුරෙන් ප්‍රසංගයක් සැලසුම් කරමු

## හැඳින්වීම

නර්තන විෂය ඉගෙනීමේ දී ඔබට විවිධ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් රැසක් පිළිබඳ අත්දැකීම් ඇත. ඒ වගේ ම පෙර පාසල, ප්‍රාථමික අංශය, දහම් පාසල, හා ළමා සමාජය ආදිය තුළ විවිධ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වී ඔබේ දැනුම් කුසලතා සතුටින් ඉදිරිපත් කරන්නට ඇත. එම අත්දැකීම් ඇසුරින් තෝරා ගත් අංග කිහිපයක් වේදිකාවක ඉදිරිපත් කරන්නට හැකිනම් ඔබ සතුටු වෙනවා ඇත. මේ සඳහා හොඳ සූදානමක් අවශ්‍යයි. එවැනි අවස්ථා මගින් ලබන විවිධ අත්දැකීම් අපේ කලා කුසලතාවන්ට මෙන් ම අනාගත ජීවිතයට ද වැදගත්වේ.

මේ වටිනා අවස්ථාව සඳහා හොඳ සූදානමක් අවශ්‍යයි. ඔබට කළ හැකි සුවිශේෂ කාර්යයන් කිහිපයක් ඇත. ඒ සඳහා තම පන්ති කාමර මිතුරු මිතුරියන්ගේ සාමූහික එකමුතුව, දායකත්වය, වගකීම, කාර්යශූර බව ආදිය මෙන් ම වැඩිහිටියන්ගේ උපදෙස් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සංවිධානය කර ගත යුතු 6 ශ්‍රේණිය නර්තන කලා සිසු එකමුතු ව මෙහෙයවා, සැලසුම් කර, ප්‍රසංග අවස්ථාවක් නිර්මාණය කර ගැනීම අප විසින් ම සිදු කළ යුතු ය. ඒ තුළින් ලබන නිර්මාණාත්මක අත්දැකීම වසර අවසානයේ සාර්ථක ප්‍රසංග අවස්ථාවක් ඉදිරිපත් කිරීමට උපකාරී වේ.

### මෙම ක්‍රියාකාරකමින් ...

- ප්‍රසංගයට උචිත කලාංග තෝරා ගැනීමට
- ප්‍රසංගය ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගෙන නම් කරන්නට
- ප්‍රසංග අංග අනුපිළිවෙළ සැලසුම් කර ඉදිරිපත් කිරීමට.
- රංග උපකරණ හා මෙවලම් සපුරා ගත හැකි අයුරු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට
- කාලය මනාව පාලනය කරමින් නිර්මාණ කිරීමේ වැදගත්කම ප්‍රකාශ කිරීමට
- කණ්ඩායමක් සමග සතුටින් වැඩ කරන්නට

ඔබට හැකියාව ලැබෙනු ඇත

## පෙර සූදානම

අපි මෙම චිත්‍රමය රූපසටහන් හොඳින් නරඹමු. ඒවා අලංකාර නර්තන අංග ඉදිරිපත් වන අවස්ථා කිහිපයකි. ඒ අනුව A, B, C ලෙස දක්වා ඇති විචිත්‍රවත් නර්තන අංග සහිත ඡායාරූප ඔබේ කැමැත්ත අනුව 1, 2, 3 ලෙස අභ්‍යාස පොතේ සටහන් කරන්න.

A



B



C



අප අවට පැවැත්වෙන විවිධ උත්සවයන්හි ඇතුළත් නර්තන අංග අතර ලී කෙළි නැටුම බහුල ව දැක ගත හැකි ය. එසේ ම මේ වනවිට ඔබ නැටුම් පංති කාමරය තුළ දී ද, ලී කෙළි නැටුම හඳුනාගෙන ඇත. එහෙත් එම නැටුම අභ්‍යාස කිරීමට අමතර ව වෙනත් ස්ථානයක දී ඉතා විසිතුරු ලෙස ඉදිරිපත් කෙරෙන අයුරු දැක ගත හැකි ඡායාරූප පහත දැක්වේ.





මෙම ඡායාරූප හොඳින් නිරීක්ෂණය කරන්න. ඒ අනුව පහත සඳහන් වාක්‍ය මගින් ඉදිරිපත් කර ඇති කරුණු ඔබේ අභ්‍යාස පොතේ සටහන් කර ඔබ ඒ සමග එකඟ වන්නේ නම් (√) ලකුණ ද නැතහොත් (×) ලකුණ ද ඉදිරිපස කොටුවේ යොදන්න.

- ගැහැනු පිරිමි මිශ්‍ර වූ සමූහ ලී කෙළි නැටුමකි. ☐
- නර්තනය සඳහා ම අවකාශය වෙන් කළ ස්ථානයක් ඇත. ☐
- රංගනය සඳහා උපකරණ ලෙස ලී යොදා ගෙන ඇත. ☐
- විවිධ වර්ණ සහිත නර්තන ඇඳුමින් සැරසී ඇත. ☐
- ගැට බෙරය, තම්මැට්ටම ආදි විවිධ භාණ්ඩ ඇත. ☐
- විවිධ වර්ණ ආලෝක ලැබී පසුබිම ආලෝකවත් වී ඇත. ☐

## පියවර 01

- ගුරුතුමිය විසින් සුදුසු යැයි අනුමත කරන ලද වීඩියෝ පටයේ ඇතුළත් ප්‍රසංගය හොඳින් නරඹන්න.
- එම ප්‍රසංගයේ ඇතුළත් ඔබ මෙතෙක් ඉගෙනුම ලැබූ අංග නිරීක්ෂණය කර අදාළ පිළිතුර සටහන් පොතේ ලියන්න.

**පහත සඳහන් ප්‍රශ්න අභ්‍යාස පොතේ සටහන් කර පිළිතුරු ලියන්න.**

1. ප්‍රසංගය ආරම්භයේ සිදු කළ චාරිත්‍රයක් නම් කරන්න.
2. ප්‍රසංගයේ විස්තර කථනය සිදු කළ පුද්ගලයා හඳුන්වන නාමය කුමක් ද
3. ප්‍රසංග අංග ඉදිරිපත් කළ ස්ථානය හඳුන්වන නම ලියන්න.
4. ප්‍රසංගයේ දී දුටු  ඔබ මෙතෙක් ඉගෙනුම ලබා ඇති නර්තනයක් නම් කරන්න.
5. ආරම්භක නර්තන අංගයේ නම හා එහි අරමුණ කෙටියෙන් ලියන්න.
6. එක් ප්‍රසංග අංගයක් ඉදිරිපත් කිරීමට ගත වූ සාමාන්‍ය කාලය කොපමණ ද?
7. සෑම නර්තන අංගයක් සඳහා ම පසුබිම් සහාය ලබා දුන් අංග 2ක් නම් කරන්න.
8. ප්‍රසංගය අවසානයේ සිදු කළ කතාව කුමක් ද?

## පියවර 02

- නර්තන විෂය ඉගෙනීමේ දී ගායන, වාදන, නර්තන හා විවිධ චරිත නිරූපණ අභ්‍යාස කරන්නට ඇත. ඒවා හි සුන්දරත්වය, සතුට විඳීමට අවස්ථාවක් උදා කර ගනිමු. මේ සඳහා සූදානම් වන අයුරු ගුරුවරයා සමග සාකච්ඡා කරන්න.

- ගුරුවරයාගේ උපදෙස් අනුව මූලික සාකච්ඡාව සිදු කරන්න.
- මූලික අදහස් හුවමාරුවකට යොදා ගත හැකි පාර්ශව කිහිපයකි.

### මූලික සාකච්ඡාව

- විදුහල්පති
- 6 ශ්‍රේණිය නර්තන සිසුන්
- ජ්‍යෙෂ්ඨ නර්තන සිසුන්
- දෙමව්පියන්
- නර්තන විෂයභාර ගුරුතුමා
- පන්තිභාර ගුරුතුමා

## පියවර 03

සාකච්ඡාවේ දී අංශභාර/ නැටුම් විෂයභාර ගුරුතුමා විසින් ඉදිරිපත් කරන අදහස් පහත දැක් වේ. එම අදහස්වලට ඔබ එකඟ වන්නේ නම් ඒ ඉදිරියෙන් ඇති කොටුව තුළ (√) ලකුණ ද, එකඟ නොවන්නේ නම් (×) ලකුණ ද අභ්‍යාස පොතේ සටහන් කරන්න.

### සිසු ක්‍රියාකාරකම 2

| ඉදිරිපත් වූ අදහස් | | |
|---|---|---|
| 1 | සැලසුම, සංවිධානය හා සාමූහික බව | |
| 2 | විවිධ කලාංග තිබිය යුතු බව | |
| 3 | පෙර පුහුණුව හා අවසන් පෙරහුරුව අවශ්‍ය බව | |
| 4 | චාරිත්‍ර විධි හා සාරධර්ම පිළිපැදීම | |
| 5 | උචිත නර්තන අංග නිර්මාණය කලයුතු බව | |
| 6 | විවිධත්වය අනුව අංග පෙළගැස්වීම | |
| 7 | නර්තන, ගායන, වාදන, රංගවස්ත්‍ර, සැරසිලිවල කලාත්මක බව | |
| 8 | අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුගත කිරීම | |
| 9 | ආරාධනා පත්‍ර සැකසීම/ ප්‍රචාරක හා සංග්‍රහ කටයුතු | |
| 10 | රංග උපකරණ/ රංගවස්ත්‍ර සැකසීම හා අංග රචනය | |
| 11 | ප්‍රසංගයට සුදුසු තේමාවක් අවශ්‍ය බව | |
| 12 | ප්‍රසංගයට සක්‍රියව දායකවීමෙන් ජීවිතයට ලැබෙන අත්දැකීම | |
| 13 | සාමූහිකව කටයුතු කිරීමේදී නායකත්වයට ගරුකිරීම | |

6 ශ්‍රේණියේ සිසුන්ගේ වර්ෂ අවසාන කෙටි නර්තන ප්‍රසංගයක් පැවැත්වීම පිළිබඳ සාකච්ඡාවට බඳුන් කළ යුතු පහත සඳහන් අවස්ථා අභ්‍යාස පොතේ අනුපිළිවෙළින් පෙළගස්වන්න.

- ස්තුති කථාව
- පුහුණු වේලාව
- වාද්‍ය භාණ්ඩ සපයා ගැනීම
- පවත්වන ස්ථානය තෝරා ගැනීම
- සරල ඇඳුම් සපයා ගැනීම

- ප්‍රසංග අංග තෝරා ගැනීම
- දිනය හා වේලාව
- පසුබිම් ගායන/ වාදනයට සිසුන් තෝරා ගැනීම
- නිවේදන කටයුතු සඳහා සිසුවෙක් තෝරා ගැනීම
- සරල පසුබිම් සැරසිලි
- සිසු සංවිධාන කමිටුව පත් කිරීම
- ප්‍රසංගය පවත්වන කාලය
- සංග්‍රහ කටයුතු
- ආරාධනා පත්‍ර
- පිළිගැනීමේ කථාව

## පියවර 04

- සැලසුම් සහගත ව සාමූහිකත්වයෙන් යුතු වූ සාර්ථක නර්තන ප්‍රසංගයක් පැවැත්වීම සඳහා සිසු සංවිධාන කමිටු විධිමත් කර ගැනීම අවශ්‍ය වේ. කමිටුවේ වගකීම් ඉටුකිරීමේ දී පහත සඳහන් ගුණාංග ආරක්ෂා කිරීම ප්‍රසංග සැලසුම සාර්ථක වීමට හේතු වේ.
- ගුරු අධීක්ෂණය/ උපදෙස් යටතේ කමිටු කාර්යයන් සිදු කිරීම.
- කණ්ඩායම් එක් ව සහයෝගයෙන් කටයුතු කිරීම.
- තම තමන්ට පැවරෙන වගකීම නිසි ලෙස ඉටු කිරීම.
- නායකත්වයට ගරු කිරීම.
- අන්‍ය අදහස් විමසීම හා පිළිගැනීමට නම්‍යශීලී වීම.
- නියමිත දිනයට/ වේලාවට කාර්යය ආරම්භය හා අවසානය
- අවංක ව විනිවිද බවින් යුතු ව කටයුතු කිරීම.
- පහත නම් කර ඇති සිසු සංවිධාන කමිටු සඳහා සාමාජිකයන් පත් කර ගනිමු.
- එහිදී හැකියාව, ශක්තිය, කාර්යශූර බව හා එකමුතු ව කටයුතු කළ හැකි වීම ආදිය සැලකිල්ලට ගැනීම සුදුසු ය.
- ප්‍රසංග අංග සඳහා පෙනී සිටින සිසුන් කමිටු සඳහා ඇතුළත් නොකළ යුතු ය.

  ⋆ සැරසිලි කමිටුව

★ ශාලා කමිටුව
★ සංග්‍රහ කමිටුව
★ උපකරණ සැපයීම් කමිටුව
★ ඇඳුම් පැළඳුම් සැපයීම් කමිටුව

### ඇමුණුම 01

ඔබ මෙතෙක් නර්තනය පිළිබඳ ලබා ඇති අත්දැකීම් හා 6 ශ්‍රේණියේ පළමුවන වාරය තුළ ඉගෙනුම ලැබූ නර්තන පාඩම් ඇසුරෙන් ප්‍රසංගයට සුදුසු නර්තන අංග තෝරා ගත යුතු ය. ඔබේ ගුරුතුමාගේ උපදෙස් මත නිර්මාණය සඳහා නම් කළ අංග ප්‍රසංගයට ගැළපෙන පරිදි අනුපිළිවෙළින් 1, 2, 3, 4 හා 5 වශයෙන් අංකනය කරන්න.

| ඇසුරු කර ගත් මෙතෙක් ඉගෙන ගත් ක්‍රියාකාරකම් | නිර්මාණය වන නැටුම | අනුපිළිවෙළ |
|---|---|---|
| ගැමි නැටුම් | - ලී කෙළි | |
| පරිසරය ආශ්‍රිත ගීත නර්තන | - පරිසර රැඟුම | |
| නමස්කාරය | - පූජා නමස්කාරය | |
| විකල්ප වාද්‍ය උපකරණ | - විකල්ප වාදන නිර්මාණය | |
| පෙරහැර | - කාවඩි | |

## පියවර 05

■ පහත සඳහන් වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරතවන්න.

## ස්වයං තක්සේරුව

| | මට දැන් කළ හැකි ය. | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1 | ප්‍රසංගයට උචිත කලා අංග තෝරා ඉදිරිපත් කිරීම | | | | |
| 2 | ප්‍රසංග අංග ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා නම් කිරීම. | | | | |
| 3 | ප්‍රසංග අංග අනුපිළිවෙළ සැලසුම් කර ඉදිරිපත් කිරීම | | | | |
| 4 | රංග උපකරණ හා මෙවලම් සපුරා ගත හැකි අයුරු පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම. | | | | |
| 5 | කණ්ඩායමක් සමග සතුටින් කටයුතු කිරීම. | | | | |
| 6 | ප්‍රසංගයක් සැලසුම් කිරීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම | | | | |

## ඉදිරි පෝෂණය

සිසු කමිටු සාමාජික අදහස් හා ගුරු ඇසුර ලබමින් අදාළ වගකීම්, ඉටු වන කාල සීමාව පිළිබඳ ව මෙන් ම තෝරා ගත් නර්තන අංග ගැළපීම පිළිබඳ තවදුරටත් සාකච්ඡා කරන්න.